# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2021.02.16

වර්ෂ 2021 ක් වූ පෙබරවාරි මස 16 වන අඟහරුවාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ පෙබරවාරි මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**සහභාගීත්වය.**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
04. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
05. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
07. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
10. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
11. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
12. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
13. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
14. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
15. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
16. ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
17. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
18. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
19. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
20. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**නොපැමිණි.**

01. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
02. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය

මීට අමතරව ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා ද සහභාගී විය.

**ආගම සිහි කිරීම හා සභාව පිළිගැනීම.**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සියලුම ගරු සභිකවරුන්, ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් හා මාධ්‍යවේදීන් පිළිගැනීමෙන් අනතුරුව පළමුව ආගම සිහිපත් කරන ලදී. ඉන් අනතුරුව විනාඩියක නිශ්ශබ්දතාවය රැකීමෙන් රට වෙනුවෙන් සටන් වැද මියගිය රණවිරුවන් හා මියගිය සභිකවරුන්, නිලධාරීන් හා සේවකයන් සිහිපත් කරන ලදී.

(ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම**

**01) 2021-01-27 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2021-01-27 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා, විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන්න. නැත්නම් 2021-01-27 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස යෝජනා කරන්න. සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** 2021-01-27 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

සංශෝධන නැතිබවයි පෙනෙන්නේ.

2021-01-27 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** විශේෂ නිවේදන යටතේ මට එක කාරණාවක් කියන්න තියෙනවා. මොකද, මාධ්‍යවේදීන් කිහිපදෙනෙක්ම මගෙන් ඒකට ඉල්ලීමක් කරා. අක්මීමන ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීම තියෙන්නේ තුන්වන සතියේ අඟහරුවාදා දිනයට. මාධ්‍යවේදීන්ට මේ මහා සභා රැස්වීම් දෙකටම සහභාගී වීමේ අපහසුතාවයක් තියෙනවා කියලා දිනය වෙනස් කරන්න පුළුවන්ද කියලා ඉල්ලීමක් කරා කිහිපදෙනෙක්ම මාව හමුවෙලා. මම හිතන්නේ බදාදා දිනයට වුණත් අපිට දැන් මහා සභා රැස්වීම තියන්න පුළුවන්. බදාදාට මහා සභා රැස්වීම තියන්න බැරි වුණේ මහජන දිනය තිබුණ නිසා. දැන් බදාදා දිනයේදී වුණත් අපිට මහා සභා රැස්වීම පවත්වන්න පුළුවන්. මහා සභා රැස්වීම තුන්වෙනි සතියේ බදාදා දිනයට වෙන්කර ගත්තොත් කොහොමද, සභාවේ වැඩ කටයුතු මාධ්‍යයට යන්නත් ඕන. මහජන හමුව දැන් සඳුදා දිනයට තියෙන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒක ප්‍රශ්නයක් නැහැ මහජන දිනය දැන් සඳුදට තියෙන නිසා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක ප්‍රශ්නයක් නැහැ. නමුත් මාධ්‍යවේදීන් මේ ඔක්කොම ඇවිල්ලා නෙමෙයි ලියන්නේ. ඊළඟ කෙනාගෙන් ඉල්ලාගෙන ලියන්නේ.

(ගරු මන්ත්‍රිනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒ දිනය හොඳයි. අපි මේක වෙනස් කරමු. නමුත් මාධ්‍යවේදීන්ට සභාවල් බෙදලා දීලා තියෙනවා. ලංකාදීප පත්තරයෙන් එහෙම ඔයාට මේ සභාව, ඔයාට මේ සභාව කියලා බෙදලා දීලා තියෙනවා. ඒ දිනයේ ප්‍රශ්නයක් නැහැ. ඒක කරමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාවේ එකඟතාවයෙන් අපි මහා සභා රැස්වීම බදාදා දිනයට යොදා ගමු.

ලීඩ්ස් ආයතනයෙන් අපිට කලින් කොළඹ අභියාචනාධිකරණයෙන් වාරණයක් අරගෙන තියෙනවා අපි නඩු දාන්න ලේස්ති වෙලා තියෙනවා කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක අර අත්අඩංගුවට ගන්න එපා කියනවා වගේ එකක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** උඩ තියෙන පාර සම්බන්ධව පොලීසියෙන් දාපු නඩුව හෙට දිනයේදී කැඳවලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක පිළිබඳව ගත්තම ඇත්තටම ගරු සභාපතිතුමා අපේ හිතවත් නීතිඥ මහත්වරු මේ ඉන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ. අබේසේකර මන්ත්‍රීතුමා මෙහෙමයි. දැන් අද හවස 03.00 ට විශ්වනාත් අරඹේවෙල නීතිඥතුමා එනවා කියලා තිබුණා සභාවට. ඔබතුමන්ලාගෙන් එන්න පුළුවන් අය ඒකට සම්බන්ධ වෙලා මේක ගැන ඕන තීන්දුවක් ගන්න. මටනම් ඒක ගැන කිසි ප්‍රශ්නයක් නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** විශ්වනාත් නීතිඥතුමාට නඩුව දෙන එක පිළිබඳව නෙමෙයි අපිට ප්‍රශ්නය තියෙන්නේ. ඇත්තටම අපි නඩු භාර දෙනකොට ලිපිගොනුවක් තියෙන්න ඕන. එහෙම නැතුව අපි නඩු භාර දුන්නා කියලා කරන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ තියෙන ප්‍රශ්න ඔක්කොම අද කතා කර ගන්නකෝ. විශ්වනාත් අරඹේවෙල සහ රජීන්ද්‍ර නාරංගොඩ නීතිඥ මහත්වරු මේකට පෙනී සිටින්නේ. ඒ අය මේක හදලා කිව්වා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නැහැ. මෙහෙම තියෙන්නේ. අපිට ඇත්තටම එකක් තියෙන්නේ දැන් නඩු භාර දුන්නට පස්සේ අපි මොනවත් කතා කරන්න යන්නේ නැහැ. මේ සියළු නීතිඥ මහත්වරු අපි දන්න කියන අපිට හිතවත් අය. ඉතිං ඇත්තටම අපි මේ ගැන අදහස් දක්වන්න යන එක හොඳ නැහැ. නමුත් එකක් තියෙනවා ඇත්තටම මේ කමිටුව එක්කත් සාකච්ඡා කරන්න නඩු භාර දෙන්න යනකොට කාටද මේ නඩුව භාර දෙන්නේ කියලා. එතකොට අපිට කමක් නැහැ නඩුව කාට භාර දුන්නත්. නඩුව භාර දෙන කොට අපි ළඟ තියෙන ලියකියවිලි සහ සභාව සතුව තියෙන ලියකියවිලි ඉදිරිපත් කරලා අහන්න ඕන මෙන්න මේ නඩුව ඔබතුමන්ලාට දිනලා දෙන්න පුළුවන්ද බැරිද කියලා. මේකට මෙහෙම කාලය ගන්න බැහැ. අපි දන්නවානේ මේවායේ කාලය ඇදලා යනවා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි මෙතනදී අබේසේකර මන්ත්‍රීතුමා එක අවාසියක් අපේ පැත්තෙන් තියෙනවා. ඒක තමයි දිගින් දිගටම කියන්නේ. ඒ අවාසිය විශ්වනාත් නීතීඥතුමා ආවරණය කරා. මේ අවාසිය තමයි දඩයකට යටත්ව සැලසුම් කමිටුව මේක අනුමත කරලා තියෙන එක. එතනදී බරපතල අවාසියක් අපිට තියෙනවා. නමුත් ඊට පස්සේ, විශ්වනාත් නීතීඥතුමා මේක එවන්න මාසයකට විතර කලින් අපි සම්පූර්ණයෙන්ම ඒ අය නීති විරෝධීව කරපු ඉදිකිරීම එකින් එකට මැනලා එක නඩුවක් විදියට ගෙනයන්න පුළුවන් වෙන්න ගොනු කරලා තියෙනවා. ඒකෙන් අපිට ලොකු වාසියක් තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක එකක් ගරු සභාපතිතුමා. අපි මේක ගැන කතා කරොත් එහෙම තහනම් කරලා හරි හෝ වැරදි විදියට දඩ මුදල් තීරණය කරලා තියෙද්දී ඒ අය මේ ඉදිකිරීම කරලා තියෙනවා. ඊළඟට අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් අවසර අරගෙන නැහැ. බොහොම පැහැදිළිව ඒ ලිපිගොනුවේ තියෙනවා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අවසර අරගත යුතුයි කියලා. ඒක අරගෙන නැහැ. මගේ ළඟ ඒ ලිපිගොනුව තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කියන්නේ අබේසේකර මන්ත්‍රීතුමා, විශ්වනාත් නීතිඥතුමාට දීපු එකේ ගැටළුවක් තියෙනවා නම් විතරක් අපි කතා කරමු. එහෙම නැත්නම් අද හවස 03.00 ට එතුමා සභාවට එනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේකෙ මෙහෙමයි සභාපතිතුමා තියෙන්නේ. කමක් නැහැ. කොහොම හරි අපි එන්න ඕන. අපෙත් මේකට වුවමනාව තියෙනවානේ. අපි මේකට හැම තිස්සෙම කෑ ගහනවානේ. ඒ නිසා කොහොම හරි එන්න ඕන. අද දවසෙ මේක කරලා අපිට ගෙදර යන්න හරි, වෙන වැඩ හරි තියෙන්න පුළුවන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක නෙමෙයි ප්‍රශ්නය. දවස් තුනක් ඒ අය නම් කරලා තියෙනවා. 18, 21, 22 වෙනිදද කොහෙද උත්තර බඳින්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ කියන්නේ කොළඹ එකට උත්තර බඳින්නද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒකට කමක් නැහැ. ඒකට උත්තර බඳින එක බොහොම ලේසි වැඩක්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට අධිකරණය නෙමෙයි ඒක දැනුම් දීලා තියෙන්නේ. නීතිඥතුමා හරහා තමයි ඒක දැනුම් දීලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එහෙම එවනවානේ. අරකෙත් එහෙම තමයි එවුවේ. ඉතිං මම කියන්නේ සභාපතිතුමා ඉස්සරහ කාලයේදී අපි නඩු කියන කොට සාකච්ඡා කරමු කාටද දෙන්නේ කියලා. කණ්ඩායමක් විදියට අපි සාකච්ඡා කරලා ඒක භාර දෙමු. ඊළඟට අපි වහාම ඒකට ගන්න ඕන ක්‍රියාමාර්ගයක්. ඔයගොල්ලෝ ඇත්තටම මේ ප්‍රශ්නය දිහා පොඩ්ඩක්වත් හිනා වෙලා බලන්න යන්න එපා. මොකද හේතුව මේක ප්‍රශ්නයක් තව ටික දවසකින් සභාවට.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඕකෙදී නඩු භාර දීම සම්බන්ධව කියන්නේ. අපි අර හපුගල ලී මෝලේ නඩුව පැරදුණා කියනවානේ. මම තැන මොකක්ද කියලා දන්නේ නැහැ. ඒ කෙනාටම දීලා තියෙනවා හිරිඹුර පැතුම් උයනේ නඩුවත්. ඒකත් පරදින්නද දුන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඇත්තටම භාර දීපු නඩු ගැන ඇහුවම අපිට කිවුවේ මේ දෙක විතරයි කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** දැන් ඒක ගැන දන්නෙත් නැහැ ඇහුවම. ඒකත් පරදින්නද දුන්නේ. මම ඒක ගැන අහන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අලුතෙන් නෙමෙයි දුන්නේ. ඒ කාලෙම දීපු එකක්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** දැන් එයා දන්නේ නැහැ නඩුව තියෙන දවසවත්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් ඇත්තටම අපිට අහන්න ඕන මේකෙ නඩුව ගෙනියන්න පුළුවන්ද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොන නඩුවද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් ඔබතුමාටයි, මටයි මේක ප්‍රශ්නයක් නෙමෙයි. මොකද හේතුව අපි දන්නවා. අර ගොවිජන සේවා මධ්‍යස්ථානයේ හිටියා නිලධාරියෙක්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** නඩු පැරදුණාම නිකං ලැජ්ජාවක් විතරයි ඉතුරු වෙන්නේ. දැන් එයා මේ ගැන කිසිම කරුණක් හොයන්නේ නැහැ. මොනවක්වත් කරන්නේ නැහැ. සභාවෙන් මේ මුදල් දීලා වැඩකුත් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කවුද ඒ නීතිඥතුමා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සිසිර වීරසූරිය මහත්තයා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් ඒ භාර දීපු නඩු ගැන දන්නේ නැහැ. අපේ හිතවතෙක් ඒ. ඒක ගැන ප්‍රශ්නයක් නැහැ. එතුමාට ඒ නඩු භාර දීපු බව අපි දන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අද ඊයේ භාර දීපුවා නෙමෙයි මේ. දැන් අවුරුදු දෙක හමාරකට වැඩියි භාර දීලා. මම සභාපති වෙලා ආපු මුල් කාලයේදී භාර දීපු එකක් මේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේක නඩුවක් විදියට පවත්වා ගෙන යන්න කියන එක කියන්නේ. නැත්නම් අපි මේක ඉල්ලා අස්කර ගෙන හරි පැත්තකට වෙමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොමත් අපි ඒ නඩුවේදී බෑන්ට සහනයක් ලබා දෙන්න නේද ඉන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** බෑන්ට සහනයක් ලබා දෙන්න අපි කතා කරේ නැහැනේ. කාණු ටික තියන්න කියලානේ කිවුවේ. දෙපැත්තේ කාණු ගැනනේ එදා අපි කතා කරේ. ඒ නඩුවෙන් මේ කොනේ එක්කෙනයි, ඒ කොනේ එක්කෙනයි පැටලුණ ගැටළුවනේ ඔතන තියෙන්නේ. දෙපැත්තේ හිටපු මුස්ලිම් පාර්ශව දෙකකට නඩු දාලා තියෙන්නේ. නඩු දානවා නම් ඔක්කොටම නඩු දාන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ඒ පාර්ශව දෙකට සහනයක් ලබා දෙන්න නේද කතා කරේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** පාර්ශව දෙකකට නෙමෙයි උඩ පැත්තේ තියෙන්නේ ගොඩ ඉඩමනේ. මම කියන්නේ ඒක නෙමෙයි. මේ නඩු යනවා නම් නඩුව දිනන්න යන්න ඕන. නැත්නම් නඩුවෙන් අයින් වෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔය සම්බන්ධව අපි වෙනම කතා කරමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා පාසලක් විදියට මේක පවත්වා ගෙන යාමේ කිසිම හැකියාවක් ලීඩ්ස් පාසලට ඇත්තේ නැහැ. ඊළඟට නැවත ගොඩ නගනවා නම්, තාප්පය බඳිනවා නම් ඒ ගොඩනැගිල්ලේ උසත් එක්ක පිටිපස්සෙන් තියන්න ඕන දුර ප්‍රමාණයක් තියෙනවා. කණ්ඩි වලට ඒක බලපානවා. ඉතිං මේවා ගැන අපි කතා කරලා මම දැක්කේ අද වෙන කොට සභාවට බරක් දාන්නේ නැතුව සභාව පැත්තකින් තියලා කවුරුත් එකතු වෙලා වැඩ කරන්න. මම අදහසක් විදියට කියනවා මමත් රුපියල් දාහක් දෙන්නම්. අපි සියළුදෙනාම දායකත්වය සපයලා මේකට විරුද්ධව අපි නඩුවක් දාමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොහොකට විරුද්ධවද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** පාසල පවත්වාගෙන යාමට විරුද්ධව. අර නඩුව වෙනම යන්න කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනවසර ඉදිකිරිම සම්බන්ධ නඩුවේදී ඒක අපිට ඉල්ලන්න පුළුවන්නේ. ඉදිකිරීම අසමත් කියන්නේ පාසලක් පවත්වා ගෙන යන්න බැහැනේ. පළවෙනි නඩු වාරයේදීම ඒක අපිට ඉල්ලන්න පුළුවන්. ළමයින්ගේ ආරක්ෂාව ගැන කියලා, ළමයි එන එක නවත්වන්න කියලා ඉල්ලන්න පුළුවන්. අපි ඒකට වෙනම නඩුවක් දාන්න ඕන නැහැ. කෙලින්ම ඒක ගන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා නැවතත් ඔබතුමාගෙන් මේක ඉල්ලා සිටිනවා. නඩු ටික භාර දෙන කොට අපි කවුරුත් සාකච්ඡා කරමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් කිවුවානේ ප්‍රසිත් වල්ගම නීතිඥතුමාට නඩුව භාර දුන්නා කියලා ඔබතුමන්ලා කතා කරලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි දන්නේ නැහැ නඩු කාට භාර දුන්නද කියලා. මම කිවුවේ ඒ අයට නඩු භාර දෙන කොට අපි ඇත්තටම එකතු වෙලා සාකච්ඡා කරමු මේ නඩුව කාටද භාර දෙන්නේ කියලා. නඩුව භාර දීලා ඉවර වෙලා කතා කරන්න ගියාමනේ ප්‍රශ්නය තියෙන්නේ ඇත්තටම. අපි ඉස්සෙල්ලා කතා කරමු. දැන් නඩු තියෙන ඒවා කතා කරලා නඩු කාටද භාර දෙන්නේ කියලා අපි සාමූහිකව කතා කරමු. කමිටුවේ අයම වෙන්න ඕන නැහැ. අපි ඔක්කොම හරි එකතු වෙලා සාකච්ඡා කරමු. එහෙම කරලා නඩු භාර දෙමු.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමනි, අපි දැන් පහුගිය දවස්වල බංගලාවත්තේ බැම්මක් ගැන කතා කරා. දැන් ඒක ඉවත් කිරීම ආරම්භ කරලා තියෙනවා. ඒක ලොකු දෙයක්. ඒක ගිහිල්ලා බලලා ඔබතුමත් ඒ වෙනුවෙන් පෙනී සිටියා. සභාවක් හැටියට ඒ කොට්ඨාශයේ මිනිස්සු අපිට ගෞරව කරනවා. ලංකාදීප පත්තරයෙනුත් ඒ පිළිබඳව අවධානය යොමු කළා. මගේ ආසන්න කොට්ඨාශයේ ප්‍රශ්නයක් වුණත් මේකට මැදිහත් වුණ කෙනෙක් විදියට මේ සභාවට, සභාපතිතුමාට, නිලධාරි මණ්ඩලයට ස්තුතිය පුද කරනවා.

**<u>ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.</u> ඃ- නැත**

**<u>(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න</u> ඃ- නැත**

**<u>(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා</u>**

**<u>ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** මවුන්ට්ප්ලසන්ට් වත්තේ අතුරු මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02.** නිලදෙණිය මාර්ගයේ අතුරු මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** කොරෝනා වෛරසය ව්‍යාප්තවීම නිසා උපකාරක පන්ති පැවැත්වීම රජය විසින් තාවකාලිකව නතර කළ බැවින් උපකාරක පන්ති පැවැත්වීම සඳහා මාසික කුලී පදනම මතා ලබා දී ඇති වටරක නැගෙනහිර ප්‍රජා ශාලාවේ 2020 වර්ෂයේ ඔක්තෝම්බර්, නොවැම්බර් සහ දෙසැම්බර් මස මාසික බදු මුදල් අය නොකර සිටීමටත්, එම මාස තුන සඳහා ගෙවිය යුතු රු.6,000.00ක් වන බදු මුදල් පොත්වලින් කපා හැරීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04.** අප ප්‍රාදේශීය සභාව සතු වී.සී පාර, කලේගාන යන ලිපිනයේ පිහිටි ඉඩමේ ඉදිකරන ලද නව ගොඩනැගිල්ලේ බිම් මහලේ එක් කොටසක ලී කැටයම් අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා ජාතික ශිල්ප සභා ඒකාබද්ධ බෝපෙ පෝද්දල ලී කැටයම්කරුවන්ගේ ශිල්ප සංවර්ධන සමිතිය වෙත තක්සේරුවක් සිදුකර මාසික කුලී පදනම මත බදු දීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒක ගැන තව ලියුමක් අපිට හම්බවුණා. පුබුදු ග්‍රාම සංවර්ධන සමිතිය මඟින් ඉල්ලීමක් කරලා තියෙනවා එතන කාමරයක් අවශ්‍යයි කියලා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඒක ගැන පොඩ්ඩක් පැහැදිලි කරන්න ඕන.

වී.සී. පාරේ සභා භූමියේ නව ගොඩනැගිල්ලේ කාමරයක් ලබා ගැනීම. (ලේකම්, පුබුදු ග්‍රාම සංවර්ධන සමිතිය, කලේගාන දකුණ)

ගරු සභාපතිතුමනි, මෙතනදී මටත් මතකයි මේ යෝජනාව සභාවට ආවට අපිට ඒක අනුමත කර ගන්න බැරි වුණා. ඒක සම්මත වුණේ නැහැ. සම්මත වුණේ නැති වුණාම මේ ගමගේ මහතා සහ මේ කණ්ඩායම ඇතුළු ඒ ග්‍රාම සංවර්ධන සමිතියේ අය මට චෝදනා කරා පෞද්ගලිකව මන්ත්‍රීතුමා, ඔබතුමා මේ ගොඩනැගිල්ල හදනවට විරුද්ධ වෙලා තියෙනවා කියලා. මම කිව්වා එතකොට මම ඒකට විරුද්ධ වුණේ නැහැ, යෝජනාව දැම්මට කවුරුවත් ඒ ගැන කතා කරේ නැහැ. ඒ නිසා මේ සිද්ධිය එහෙමම යට ගියා කියලා. එතනදී මම එහෙම තමයි කිව්වේ. නමුත් ඊළඟ සභා වාරයට ඒ යෝජනාව දැම්මට පස්සේ අපි ඒකට ඒකමතිකව කැමැත්ත ලබා දුන්නා. දැන් නමුත් මේ අය කියන්නේ ඒ අයට අසාධාරණයක් සිදු වුණා කියලා. එම නිසා ගරු සභාවෙන් මම ඉල්ලා සිටින්නේ මෙම පුබුදු ග්‍රාම සංවර්ධන සමිතියටත්, මේ ඉල්ලීම ඉටු කරලා දෙන්න කියලා. ඒක මම ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා. මොකද දේශපාලන වශයෙන් අපි දෙගොල්ලොම එකම කණ්ඩායමක්. ඒ කණ්ඩායමෙන් එක් පාර්ශවයකට අසාධාරණයක් සිදුවුණාම ඒක අපේ දේශපාලන වැඩ කටයුතු කර ගෙන යාමටත්, ප්‍රශ්නයක් වන බව අපිට හැඟී යනවා. ඒ නිසා මේ ගැන අවධානය යොමු කරන්න කියලා ගරු සභාවෙන් මම බොහෝමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මොකද, භේදයක් නැතිවන විදියට මේ ප්‍රශ්නය බේරලා දෙන්න ඕන.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නය පිළිබඳව කොට්ඨාශයේ මන්ත්‍රීවරයාගේ අදහස අරගන්න. මේ පිළිබඳව අපිට අවබෝධයක් නැහැනේ.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඒක පැහැදිළි කරාවි. මගේ ඉල්ලීම ගරු සභාපතිතුමා මේක අවුරුද්දක බදු මුදලක් ලෙස අය කරන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ගැන මම පැහැදිළි කිරීමක් කරන්නම්. පළවෙනි කාරණය යුද්ධයක් කරා වගේ තමයි මේ ගොඩනැගිල්ල ඔය මට්ටමට හැදුවේ. පාර්ශව තුනක් මේ ඉඩමේ ඔය ගොඩනැගිල්ල හදද්දී මට බරපතල විදියට චෝදනා කරා. මේක ගැන කියන්න තැනින් තැන ගියා. මන්ත්‍රීවරුන්ගේ ගෙවල් වලට ගියා ඔතන ඉන්න පාර්ශව තුනක්. මම ඒ පාර්ශව තුනම ඒ ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සවයට පවා ගෙන්වා ගන්න පුළුවන් මට්ටමට අද වන විට ඒ සියළු පාර්ශවවලට සාධාරණයක් වෙන විදියට මම ඒ පළවෙනි කාරණය ඉෂ්ඨ කරා. මගේ හෘද සාක්ෂිය අනුව මම ඒ ගැන සතුටු වෙනවා කිසි කෙනෙක්ගේ අමනාපයකින් තොරව ඔය ගොඩනැගිල්ල හදන්න හැකියාව ලැබීම පිළිබඳව. ඒක පළවෙනි කාරණය.

දෙවෙනි කාරණය ඇත්තටම ඔය ගොඩනැගිල්ලට අර කිව්වා වගේ කලේගාන උතුර සහ කලේගාන දකුණ යන වසම් දෙකට ආපු ලක්ෂ 20 ගාණේ තමයි යෙදෙව්වේ. ඒ වසම් දෙකට සපිරි ගමක් වැඩසටහන යටතේ ආපු මුදල් ඒ යෙදෙව්වේ. ඉතිං ඔතනදී ඒ කියපු කතාවත් හරි. ඒ සමිතියෙනුත් මේක ඉල්ලුවා. නමුත් ඇත්තටම මුදල් ලැබීම ප්‍රතික්ෂේප වුණා ප්‍රජා ශාලා ඉදිකරන්න මුදල් දෙන්නේ නැහැ කියලා. එතකොට උපක්‍රමශීලීව දැව කැටයම්කරුවන්ගේ නිර්මාණ අළෙවි කිරීමේ මධ්‍යස්ථානයක් විදියට තමයි ඕක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අනුමත කරේ. එහෙම තමයි ඒක කොළඹට යවලා අනුමත කර ගත්තේ. ඒක කර ගත්තේ ඒ ආකාරයෙන්. මුලින් දැව කැටයම්කරුවන්ගෙන් ප්‍රශ්නයක් තිබුණේ නැහැ. නමුත් දැන් මේක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අනුමත වුණේ දැව කැටයම්කරුවන්ගේ නිර්මාණ අළෙවි මධ්‍යස්ථානයක් විදියට. එතනදී අපිට ඒ වැඩේ ඉවර වුණාට පස්සේ ඒක එහෙම නෙමෙයි කියලා කියන්න බැහැ. ඒ එකඟතාවයකට ඇවිල්ලා තමයි ඒක හැදුවේ. නමුත් තිස්ස මන්ත්‍රීතුමා දිගින් දිගටම කිව්වේ මුළු ගොඩනැගිල්ලම දැව කැටයම්කරුවන්ට ඕන කියලා. අපි දෙන්නා වාද වුණා, කතා කර ගත්තා. මම කිව්වා අඩුම තරමේ ගමේ නිලධාරීන් හතර දෙනාටවත් ඉන්න තැනක් ඕන කියලා. එහෙම කියලා තමයි යම්තම් මෙහා පැත්තේ කෑලි දෙකක් වෙන් කර ගත්තේ. ග්‍රාම නිලධාරි කිව්වා එයාට අනිත් තුන්දෙනා ඉන්න තැන ඉන්න බැහැ කියලා. එයාට වෙනම ඉඩක් වෙන් කරලා දෙන්න කිව්වා. නඩුවල ලිපි ගොනු, තව ලිපි ගොනු තියන්න ඕන නිසා. මිනිස්සු පුද්ගලිකව ඇවිල්ලා ප්‍රශ්න කතා කරනවා කිව්වා. ඒවා පොදුවේ කතා කරන්න බැහැ කියලා එතුමාට වෙනම ඉඩක් ඕන කියලා කිව්වා. ඒ පාර ඒක වෙනම වෙන් කරලා ඉතුරු නිලධාරීන් තුන් දෙනාට අතන දෙන්න සිද්ධ වුණා. ඉතිං තව ප්‍රශ්නයක් තියෙනවා සුගත් මන්ත්‍රීතුමා. ඔය සමිතියේ ඉන්න අය හැම පැත්තෙන්ම ඕක ඉල්ලනවා. ඔය ඉල්ලලා තියෙන්නේ පුබුදු ග්‍රාම සංවර්ධන සමිතිය නමින්. ඊට පස්සේ සර්වෝදය සමිතියෙන් බඩු දාන්න කියලා ඉල්ලුවා. සර්වෝදය සමිතියේ කාර්යාලය දාන්න කියලා ඉල්ලුවා. මේ සමිති කිහිපයක ප්‍රශ්නය ඔය තියෙන්නේ. එකම කොට්ඨාශයේ සමිති කිහිපයක නිලධාරි මණ්ඩලය ඔය ඉන්නේ. ඔය තත්ත්වය තුළ එක සමිතියකට විතරක් මේක ලබා දීමේ ප්‍රශ්නයකුත් තියෙනවා ඔතන. එක වෙලාවකට ඇවිල්ලා ඉල්ලනවා සර්වෝදය සමිතියෙන්. තව වෙලාවකට ඇවිල්ලා ඉල්ලනවා ග්‍රාම සංවර්ධන සමිතියෙන්. මම තීරණයක් ගත්තා මේකට. ඒ අයත් ඒකට එකඟ වුණා ඒ අවස්ථාවේදී. උඩ

තට්ටුවේ වැඩ සම්පූර්ණයෙන් ඉවර කරාට පස්සේ රැස්වීම් තියන්න ඉඩ ලබා දෙනවා. ඒ සියළු දේවල් වලට ඒ අය තීරණය කරන සමිතියක් එක්ක ගිවිසුමකට ඇවිල්ලා අපි අර බෝපෙ ප්‍රජා ශාලාවට කරා වගේ නිදහස් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒක තමයි මේ වෙලාවේදී කරන්න ඕන. අර වැඩෙත් අපිට ප්‍රධානයි. අපි එවෙලේ දුව කැටයම්කරුවන්ගේ ප්‍රශ්නය ගැන හිතුවේ නැති වුණාට වර්තමානයේදී කොරෝනා වසංගතයත් එක්ක මේ ජීවිකාව සම්පූර්ණයෙන්ම අහිමි වෙලා තියෙනවා. විදේශිකයන්ට නැතත් දේශීය අයට පවා භාණ්ඩ මිලදී ගන්න පුළුවන් ලස්සන මධ්‍යස්ථානයක් අපි හැදුවා. මේ ජීවිකාව ඒ අය කරගෙන යන්නේ මේකත් එක්කනේ. ඒක හින්දා අපි මේක අහම්බයෙන් හරි මෙහෙම වෙච්ච එක ගැන සතුටු වෙනවා. ඒක කලේගානේ අයට විතරක් නෙමෙයි, පැලවත්ත, අපේගම වගේ ඒ සියළු ප්‍රදේශවල ඉන්න දුව කැටයම්කරුවන්ගේ නිෂ්පාදන අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් විදියට මේක පවත්වා ගෙන යනවා. ඇත්තටම ඒක අහම්බයෙන් සිදු වුණාට බොහොම හොඳ දෙයක් කියලා මම කියනවා. අපි සභාවේ අරමුදලින් හරි, අපිට පිටින් එන මුදලකින් හරි උඩ තට්ටුව හදා ගමු. ඒකට ලොකු මුදලක් වැය වෙන එකක් නැහැ. යට දාපු අඩිතාලමට සෑහෙන්න මුදලක් ගියා. ඒක ගැන දකින්න ඇති ඔබතුමන්ලා. මේ වැඩේ අත ඇරලම දාන්න තිබුණ එකක්. බොහොම අමාරුවෙන් තමයි ඒ මුදලෙන් මේක කරේ. ඒ උඩ තට්ටුව දෙන්නම් කියලා මම ඒ අයට කිවුවා. මේ සභාවේදී හරි ඒ තීන්දුව ගමු.

(ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය, ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** සභාපතිතුමා මෙහෙමයි. මිනිස්සු ඉල්ලීමක් කරහම අපි ඒක ගැන කතා කරන්න ඕන. නැත්නම් සභාවේ ඉන්න එක තේරුමක් නැහැනේ. එම නිසා ඔබතුමාගේ පැහැදිළි කිරීම අපිට අවබෝධ වුණා. ඒ නිසාම ඔබතුමාම යෝජනා කරන්න ඒ ගොඩනැගිල්ලේ උඩ තට්ටුවේ සම්පූර්ණ ප්‍රමාණයම නෙමෙයි ඒ අයට අවශ්‍ය ප්‍රමාණයේ කොටසක් ලබා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සුගත් මන්ත්‍රීතුමා මම හිතන් ඉන්නේ උඩ තට්ටුවේ සම්පූර්ණයෙන්ම ශාලාවක් හදන්න. එතන පර්චස් පොඩි ප්‍රමාණයක හදපු ගොඩනැගිල්ලක් තියෙන්නේ. මිනිස්සු අසූවක්වත් දාන්න පුළුවන් විදියට ශාලාවක් හදන්නේ. අපිට පුළුවන් ඒක සම්පූර්ණයෙන්ම සමිති වලට භාර දෙන්න. සභාවෙත් යතුරක් තියලා සමිතියත් එක්ක ගිවිසුමක් ගහලා ඒක භාර දෙමු. රැස්වීම් තියෙන වෙලාවට ඒ අයට පාවිච්චි කරන්නයි, වෙනත් වෙලාවට අනෙක් රැස්වීම් තියෙන විදියටයි අපි ඒක කරමු කියන එක තමයි මගේ හැඟීම.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒ අය ඉල්ලනවානේ සර්වෝදය සමිතිය විදියටත්. ඒ අයට පැත්තකින් පොඩි කොටසක් දෙන්න කියලා ඉල්ලීම කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙමනම් මෙහෙම කරමු. උඩ තට්ටුව වෙන් කරලා හදමු. තැපැල් කාර්යාලයේ ප්‍රශ්නයත් ඉදිරියේදි එනවා. තැපැල් කාර්යාලය ඔතනින් අයින් කරන්න වෙනවා අපේ ගොඩනැගිල්ල හදන්න පටන් ගත්තාට පස්සේ. එතකොට තැපැල් කාර්යාලයටයි, සර්වෝදය සමිතියටයි ඒක දෙමු. රැස්වීම් ටික පන්සලේ තියා ගන්න කියමු. ඔය දෙකක් හැදුවම රැස්වීම් තියන්න තැනක් නැහැ. ඒකට කැමැත්තක් කරන්න. ඒකට ඕන තීරණයක් ගන්න ඒක මට කමක් නැහැ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** තැපැල් කාර්යාලය දාන්න දුන්නට පස්සේ මෙහෙට බදු මුදලකුත් එනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** රැස්වීම් තියන්න ඕන නම් පන්සලේ රැස්වෙන්න කියමු.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඔක්කොම දෙන්න බැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි කතා කරලා ඒක කරමු. ග්‍රාම නිලධාරි කාර්යාලය උඩට ගෙනිච්චහමත් ප්‍රශ්නයක් එනවා. එහෙම වුණොත් අනිත් නිලධාරීන් තුන්දෙනාගේ කාර්යාලය උඩට දාලා අපි ඒක ඒ වෙලාවට බලමු.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒක යෝජනාවක් විදියටම සම්මත කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** සභාපතිතුමා බදු ගන්න එක අවුරුද්දකින් පසුව සිදු කරන්න. බදු ඔප්පුවකුත් ඕකට ලියන්න අවුරුද්දකට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ප්‍රශ්නයක් නැහැ. බදු ඔප්පුව අවුරුදු පහකට වුණත් ලියමු.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** අවුරුද්දකින් පස්සේ බදු අය කර ගන්න කියලා කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක කරන්න බැහැ. දැන් ඒකට තක්සේරුව එනකොට පොඩි කාලයක් යාවි. ඒක ආවට පස්සේ තමයි අපි කොහොමත් ගිවිසුම් ගත වෙන්නේ. අපි මේකෙ තක්සේරුව ආවට පස්සේ කතා කරමු.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.** අප සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ පෙර පාසල් ගුරු තනතුරු දෙකෙන් එක් තනතුරක් මේ වන විට පුරප්පාඩුව පවතින අතර අනෙක් තනතුරේ සේවය කරන පෙර පාසල් ගුරුවරිය මෙම වර්ෂයේ අප්‍රේල් මස විශ්‍රාම යාමට නියමිතය. එම නිසා ස්ථිර කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සිදුකරන තෙක් තාවකාලිකව සභා අරමුදලෙන් ගෙවීම් කිරීමේ පදනම මත පෙර පාසල් ගුරුවරුන් දෙදෙනෙකු බඳවා ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, කාලයක් සේවය කරපු අයට හානියක් නොවන ආකාරයේ තීන්දුවක් අපි සියලු දෙනා ගන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනිවාර්යයෙන්ම ඒක හරි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** මම ඒකට යෝජනාවක් කරනවා. මම හිතන්නේ අබේසේකර මන්ත්‍රීතුමා කිවුවා වගේ හිරිඹුරගම සුමුදු පෙර පාසලේ අවුරුදු එකහමාරක් සේවය කරපු ගුරු මහත්මියක් ඉන්නවා ඩී. එම්. ඉමේෂිකා මදුෂානි කියලා. වසර එකහමාරක් එතුමිය සුමුදු පෙර පාසලේ සහාය ගුරුවරියක් විදියට සේවය කරා. NVQ Level 4 විභාගය සමත් ඩිප්ලෝමාධාරි ගුරුවරියක් මේ. මම හිතන්නේ ඒ අයට මූලිකත්වය ලබා දිය යුතුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි මන්ත්‍රීතුමා අපි සම්බන්ධව එහෙම කිසි දෙයක් කරලා නැහැ. ඒ අදාළ ගුරුතුමිය එතුමියගේ ස්වාමිපුරුෂයාගේ යාළුවෙක් සමඟ ඇති කර ගනිපු එකඟතාවයක් ඒක. ඒක ඒ අයම ඇතිකර ගනිපු දෙයක්. සභාව සමඟ ඒකට කිසිම සම්බන්ධයක් නැහැ. ඒ අය හොඳ වෙන කොට හොඳ වෙන්නයි, ඒ අය තරහ වෙන කොට තරහා වෙන්නයි අපිට බැඳීමක් නැහැ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම කියන්නේ මෙහෙමයි. සුදුසුකම් අනුව එතුමියට පුරප්පාඩුව සඳහා අවස්ථාව ලබා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එයාට ඒකට ඉල්ලුම් කරන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එයා එහෙම ඉල්ලීමක් කරලා තියෙනවා. ඒ ලියුම මම සභාගත කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට ආයතනයකින් පුහුණුව ලබලා ආපු කෙනෙක් ඉන්නවා. ඒ අපි දාපු කෙනෙක්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඇත්තටම සභාපතිතුමා ඒ ළමයා දීර්ඝ කාලයක් මේකෙ සේවය කරලා තියෙනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ලියනගේ මන්ත්‍රීතුමත් මේ ගැන දැනුවත් කිරීමක් කරාවි. ගොඩක් කල් එතුමිය සේවය කරලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අපි සම්මුඛ පරීක්ෂණයේදී බලමු. මන්ත්‍රීතුමා මේක අපේ එකඟතාවයකින් කරපු දෙයක් නෙමෙයි. ඒ අය කතා කර ගෙන දෙමව්පියන්ගෙන් මුදලක් එකතු කරලා දීලා තියෙනවා. එයා ස්වෙච්ඡාවෙන් වැඩ කරන්න ඇවිල්ලා තියෙන්නේ. ඊට පස්සේ දෙමව්පියන්ගෙන් මුදලක් එකතු කරලා දීලා තියෙනවා. මේක වෙනම ඒ විදියට වෙච්ච එකක්.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** සුදුසුකම් තියෙන නිසා මම කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මෙහෙමනේ. ඔය කියන විදියට දැන් එතන අර්බුදයක් නිර්මාණය වෙලා තියෙනවා. දැන් ඉන්න ගුරුතුමියගේ දුවටත් ඔය සුදුසුකම් සම්පූර්ණ වෙලා

කියලා කියනවා. ඔන්න ඔය වගේ අර්බුද ගණනාවක් ඔතන තියෙනවා. ඒක විවෘතව බලලා මොකක්ද කරන්න ඕන කියලා හිතන්න ඕන. ඔය අර්බුදය නිර්මාණය වුණේ ඒක හින්දා කියලත් හිතෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මම දන්නේ නැහැ ගුරුවරු බඳවා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳව. ඔය කියන මහත්මිය ඉන්නෙත් මගේ කොට්ඨාශයේ. හැබැයි මේ වෙන කොට නම් ඇවිල්ලා මාත් එක්ක සාකච්ඡා කරලා නැහැ මේ පිළිබඳව. අපි මෙහෙම කරමු. පෙර පාසල් ගුරුවරු බඳවා ගැනීම පිළිබඳව ප්‍රසිද්ධ කරලා සම්මුඛ පරීක්ෂණයක් තියමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එයාටත් අපි විශේෂ අවස්ථාවක් දෙනවා. එතන ප්‍රශ්නයක් නැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අවුරුදු ගාණකුත් එයා වැඩ කරලා තියෙනවා. දීමනාවකුත් ලබනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි මෙහෙමයි. ඇත්තටම මම හිටියේ ඔබතුමා ඉන්න මතයේම තමයි. නමුත් එයා මේ ගුරුතුමිය සමඟ ප්‍රශ්න ඇති කර ගෙන අපිට නෙමෙයි ඒ පිළිබඳව මුලින්ම කිවුවේ. අපෙත් ඉන්නවානේ ප්‍රජා සංවර්ධන නිලධාරි කෙනෙක්. ගයන්ත මහත්මයා ඔය සම්බන්ධවනේ ඉන්නේ. ප්‍රාදේශීය ලේකම් එකේ නිලධාරිනියට තමයි ඕක ගැන කියලා තියෙන්නේ. එහෙම වෙන්න බැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමා ඕකේ මුල ඉඳලා අවසානය වෙනකම් මම සිද්ධිය සියල්ලම දන්නවා ඕකේ ඇති වෙච්ච ගැටුම්කාරි තත්ත්වය පිළිබඳව. අපි කතා කරලා ඕකට සාධාරණ තීන්දුවක් ගමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට අපි සාධාරණයක් කරමු මොකක්ද කියලා බලලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මෙයාව අයින් කරන්න හේතුව මම විතරක් නෙමෙයි ගයන්ත මහත්තයත් දන්නවා. අපි පුහුණුව ලබන්න කෙනෙක්ව යැව්වානේ එතනට. ඒ පුහුණුව ලබන්න යවපු කෙනා මේකට දාලා එයාව අයින් කරන්න හදනවා කියලා තමයි මේ සිද්ධිය ආවේ. ඒ වෙලාවේ මම ඇවිත් ගයන්ත මහතා සමඟ මේ ගැන කතා කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ මාස හයක පුහුණුවකට දැම්මේ. ඒවගේ වෙලත් වැඩ කරන්න බැහැ එයාට.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඕකට අවශ්‍ය සාධාරණය අපි කරමු.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** සාධාරණයක් ඉටු කරන්න කියලා ඉල්ලා සිටිනවා ගරු සභාපතිතුමනි. මොකද, අවුරුදු එකහමාරක් එයා මෙතන සේවය කරලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එතනදී ඒ සාධාරණය ඉෂ්ඨ වේවි මේ සුදුසුකම් එක්ක.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මේ තනතුරට අයදුම්පත්‍ර කැඳවලාද දැන් තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තවම නැහැ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මේ සිද්ධියේදී අපිට පේනවා යම් දෙයක්. අපිට න්‍යාය පත්‍රය මහා සභා රැස්වීම පවත්වන්න යම් කාලයකට කලින් ලැබෙන්න සලස්වනවානේ. මම මීට පෙරත් මේ වගේ සිද්ධීන් කිහිපයක් දැක්කා. ඒ න්‍යාය පත්‍රයේ සඳහන් වන දේ අනුව මන්ත්‍රීවරු තව කට්ටියව මේකට පොළඹවනවා. මේ සිද්ධියට විතරක් නෙමෙයි ඒක අදාළ වෙන්නේ. ඊට පස්සේ ඒ අය අපිට වෙනම ලියාපදිංචි තැපෑලෙන් ලියුමක් එවනවා. ''මම ඒ තනතුරට ඉල්ලලා තියෙනවා, මේකට මට විශේෂත්වයක් දක්වන්න කියලා.'' අයදුම්පත්‍ර කැඳවලා සම්මුඛ පරීක්ෂණයක් මඟින් පෙර පාසල් ගුරුවරියක් හෝ වෙන තනතුරකට කෙනෙක්ව බඳවා ගන්නේ. සම්මුඛ පරීක්ෂණයකට සමහර විට අයදුම්පත්‍ර 30 ක්, 40 ක් එන්න පුළුවන්. ඒ අනුවයි මේක තෝරන්න ඕන. ඇත්ත වශයෙන්ම මේ කරන්නේ යම්කිසි බලපෑමක්. ඒ නිසා සම්මුඛ පරීක්ෂණයෙන් මේකට සුදුසු කෙනෙක්ව තෝර ගන්න.

(ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, ඒ වගේම මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මම මේක මීට ඉස්සරත්, මේ සභාවේදීම ඉල්ලා සිටියා. මොකද මම විශ්වාස කරනවා මේක බොහොම සාධාරණ ඉල්ලීමක් කියලා. ඇත්තටම ඔය පෙර පාසල තියන්න ස්ථානයක් නැති මට්ටමට ගියා. ඒ වෙලාවේදී ඇත්තටම ඒ කාලයේ ප්‍රධාන ඇමතිතුමා, අද පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා. එතුමා තමයි ඒ අවස්ථාවේදී මට ප්‍රතිපාදන දුන්නේ ඕපාත හදන්න. ඕපාත හදන්න දීපු එක තමයි මම මෙතන පෙර පාසලට යන්න තැනක් නැති හින්දා හැදුවේ. මම ඉල්ලා සිටින්නේ මේකයි. මේකට මගේ නම ගාවන්න ඕනම නැහැ. හැබැයි එකක් තියෙනවා. මේ හදන හැම එකටම ඵලකයක් තියෙනවා. මගේ නමින් නම් මේක දාන්න ඕනම නැහැ. ප්‍රධාන ඇමතිතුමාට ඒ ගෞරවය තියෙන්න ඕන. මේක අපි හැදුවා. සුගත් මන්ත්‍රීතුමයි, මමයි ගියාම එතුමා මේක හදන්න ප්‍රතිපාදන දුන්නා. පද්මසේන සභාපතිතුමා එතුමාටත් එකක් හදන්න ඕන කියලා ඉල්ලුවම උළුවිටිකේ පන්සලෙත් එකක් හැදුවා. ඊළඟට මම ඒක නිසා ඉල්ලා සිටිනවා ඔබතුමන්ලා මේකට ඵලකයක් සවි කරන්නේ නැත්නම් මම හරි ඵලකයක් සවි කරන්නම්. මගේ නම අවශ්‍යයම නැහැ මේකට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි අබේසේකර මන්ත්‍රීතුමා. මම ඒකට කිසිසේත්ම එකඟතාවයක් නැහැ. හේතුව මොකද දන්නවාද, එතුමා එවෙලේ පුද්ගලිකව කිහිප දෙනෙකුට දුන්නා. ඔබතුමයි, සුගත් මන්ත්‍රීතුමයි ගිහිල්ලා ඉල්ලුවා. ඒ දෙන්නට දුන්නා. ඊට පස්සේ අපි ඉල්ලුවා. අපිට දුන්නේ නැහැ. අපිත් මන්ත්‍රීවරු විදියට එතකොට හිටියානේ. අපිට දුන්නේ නැහැ. පද්මසේන සභාපතිතුමා ගිහිල්ලා බලපෑම් කරලා එතුමා ඒක ගත්තා. ප්‍රධාන ඇමතිතුමා හැමදාම කරේ පුද්ගලික දේවල්. අද වෙනකොට මුද්දර ගාස්තු බොහොම පැහැදිළිව, විනිවිදව ලක්ෂ 50 ක්, ලක්ෂ 70 ක් එනවා හැම සභාවකටම. නමුත් මහ ඇමතිතුමා ඉන්න කාලයේදී එහෙම නැහැ. මම ඒක ඕන වෙලාවක කියනවා. එතුමාගේ අතින් දෙනවා වගේ. එහෙම දෙන්න බැහැ කිය කිය දෙන්නේ. නොදීපු සභාවල් අනන්තවත් තිබුණා. අද අපි සතුටු වෙනවා. පොදුවේ ඒවා යන්න ඕන සභාවල් වලට ඒ ටික දැන් යනවා අබේසේකර මන්ත්‍රීතුමා.

(ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා ඔය කියන දේ සත්‍යතාවයක් ඇති. උළුවිටිකේ පන්සලේ ඒ තියෙන පෞරාණිකභාවය පැත්තකට දාලා ඇලුමිනියම් වලින් හදලා එතන කරේ. ඒකෙ වටිනාකමක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ඒ කාලයේ කරන්න තිබුණා. ඵලකයක් ඒ කාලේ හදන්න තිබුණා. බිල්ඩින් එක හදපු කාලේ ඒක සවිකරන්න තිබුණානේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අද ඒක සවිකරාම තියෙන වැරැද්ද මොකක්ද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගොඩනැගිල්ල හදලා අවුරුදු 10 ක් විතර වෙනවා. දැන් ඵලක සවිකරලා වැඩක් තියෙනවාද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක සවිකරනවාට බය වෙන්න එපා. අපේ නමක් ගහන්නේ නැහැ ඒකෙ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාගේ ප්‍රශ්නයක් නෙමෙයි තියෙන්නේ. මහ ඇමතිතුමා කරපු වැඩේට මම එකඟ නැහැ. ඔබතුමත් එක්ක ප්‍රශ්නයක් නෙමෙයි තියෙන්නේ. ඒ කරපු වැඩේට මම එකඟ නැහැ. මාත් ගිහින් ඉල්ලුවා. අපිත් මන්ත්‍රීවරු විදියට හිටියා. ඔබතුමාටයි, අබේසේකර මන්ත්‍රීතුමාටයි, පද්මසේන සභාපතිතුමාටයි විතරයි දුන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** පහුගිය කාලවලත් එතුමා ළඟට නෙමෙයි මන්ත්‍රීවරු ගිහිල්ලා තම තමන්ගේ අවශ්‍යතාවය, බල ප්‍රදේශයේ අවශ්‍යතාවය කියලා ප්‍රතිපාදන ගෙනල්ලා තියෙනවා. මම ඕක ගෙනාවේ ඕපාතට. පන්සලේ ප්‍රශ්නයක් ආවා ඔප්පුවකින් ගන්න බැහැ කියන එක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කියන්නේ ඒක නෙමෙයි. ඒ ගොඩනැගිල්ල හදන කොටම ඒක සවි කරා නම් ඉවරයිනේ. දැන් අවුරුදු 10 කට විතර පස්සේ ඕක සවි කරන්න හදන්නේ ඇයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා මම අද නෙමෙයි මේක කිවුවේ. මම දිගටම මේකට යෝජනාව ගෙනත් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ඵලකයක් කියන්නේ මොකක්ද කියන්නකෝ. ඵලකයක් කියන එක විවෘත කරන වෙලාවේදී සවිකරනවා. එක්කෝ මුල් ගල් තියෙන වෙලාවේදී සවි කරනවා. ඒ ඇරෙන්න විවෘත කරලා අවුරුදු 10 කට පස්සේ සවි කරන්නේ නැහැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඕන නැහැ. මේ වැඩේ වැරදියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වැඩේ වැරදියි තමයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** සුගත් මන්ත්‍රීතුමා එතන එලකයක් සවි කරා. දැන් මේකෙ විතරයි එලකයක් සවි කරන්න තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** දැන් එතකොට කාගෙද දුර්වලකම තියෙන්නේ. එතුමා සවි කරා නම්, පද්මසේන සභාපතිතුමා සවි කරා නම් ඇයි ඔබතුමා ඒක සවි කරේ නැත්තේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** මම දිගටම යෝජනා කරානේ. ඔබතුමා සභා වාර්තාවල් බලන්නකෝ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඉතිං ඒ කාලේ සවි කරේ කොහොමද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** මීට වැඩිය වැදගත් දේවල් තියෙනවා. ඒ නිසා මේ ප්‍රශ්නය කතා කරන්න ඕන නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** අනිත් දෙන්නම එලක සවි කරපු එකේ ඔබතුමාටත් එලකයක් සවි කරන්න තිබුණානේ. විලිලැජ්ජා නැතුව අවුරුදු 10 කට පස්සේ ඉල්ලනවා. සුගත් මන්ත්‍රීතුමා කොහොමද එලකයක් සවි කරේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** මම එලකයක් සවි කරේ නැහැ. සවි කරන්න වුණේ නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** සවිකරේ නැද්ද.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** හැබැයි අරකේ තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** කොහේද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** උළුවිටිකේ පන්සලේ එකේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එතුමා ඉතිං දක්ෂයි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා :-** මේක හැදුවම ඒ කොන්ත්‍රාත් එක කරන කෙනාට කියලා ඒක සවිකරන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** අවශ්‍යතාවය පෙන්වලා ඉල්ලුවම ඒක දෙන්න ඕන.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා :-** දකුණු පළාතේ පළවෙනි සේවා පියස හදලා මම ඒක සවිකරේ එහෙම.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා :-** ජනාධිපතිතුමා බෝඩ් ගහන්න එපා කියලා තියෙනවා. ඒ නිසා දැන් බෝඩ් ගහන්න ඕන නැහැ. ඒ නිසා ඒක ගැන දැන් කතා කරන්න එපා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** හරි දැන් ඒක ඉවරයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06.** කලේගාන පොළ පිහිටි භූමියේ නව වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීමට යෝජිත බැවින් එහි ඇති කඩ කාමර වලින් 2021 වර්ෂයේ ජනවාරි මස සිට බදු මුදල් අය නොකර සිටීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** ඒ කියන්නේ එතන කඩ කාමර කඩන හින්දද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඒවා සම්පූර්ණයෙන්ම කඩනවා. අපි මේ වර්ෂයට අදාළ බදු මුදල් ගත්තට පස්සේ මේ වර්ෂය ඉවර වෙනකම් එතන වැඩක් කරන්න බැහැනේ. ඒකයි මේක කරන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** කඩනවා නම් ප්‍රශ්නයක් නැහැ. හැබැයි ඒ කියන්නේ තව මාස හයකින් විතර ඒවා කඩනවාද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එච්චරකල් යන්නේ නැහැ මාස දෙකක් ඇතුළත කඩනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** ඒවායෙන් මාසෙන් මාසෙට බදු ගෙවනවා නෙමෙයිද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒවාට වාර්ෂික බද්දක් තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඉදිරියේදී මේක අස්කරන බව කඩ හිමියන්ට සහ පොලේ වෙළෙන්ඳන්ට දන්වලා තියෙනවාද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකත් එක්කම දන්වන්නම්. බදු මුදල් අය නොකරන කොට ඒ අය දන්නවානේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඒකට දැන්වීමක් යවන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි ඕකටම සංශෝධනයක් එක්ක සභා යෝජනාවක් ගේන්න දන්වා යවන්න කියලා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒක මම යෝජනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**07.** මීපාවල උප කාර්යාලයේ තාප්පය සඳහා ගේට්ටුවක් සවි කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**08.** තණකොළ කපන මැෂින් දෙකක්, වාහන ඇදගෙන යාමට භාවිතා කරනු ලබන දම්වැලක් සහ සිලින්ඩර් (හියුම් පයිප්ප) එසවීමට භාවිතා කරනු ලබන බෙල්ට් එකක් මිලදී ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

සභාපතිතුමා ඒ වගේම මම පහුගිය සභා දෙක තුනකටම යෝජනා කරා සිලින්ඩර් වගයක් යොදවන්න. තාම ඒවා ගෙනල්ලද කියලා දන්නේ නැහැ. හිරිඹුර ගැමුණු මාවතේ එකකුත් තිබුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගෙනාපු සිලින්ඩර් වගයක් තියෙනවා. තාක්ෂණ නිලධාරීගේ නිර්දේශය අනුව ඒවා අරගන්න ප්‍රශ්නයක් නැහැ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 09.** ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ඇති සැලැස්මට අනුව ගොඩකන්ද, ගලබඩවත්ත කුඹුරේ ස්වාභාවිකව ජලය බැසයන හීන් ඇළ පවත්නා ආකාරයෙන් පවත්වාගෙන යාමටත්, වෙනස් කරන ලද ඇළෙහි සැලැස්ම සඳහා අප ප්‍රාදේශීය සභාවේ සැලසුම් කමිටුව විසින් ලබා දී ඇති අනුමැතිය අවලංගු කිරීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේක අපේ නිවස ඉස්සරහ කුඹුරු යාය සම්බන්ධයෙන් ඇති වුණ ප්‍රශ්නයක්. ඒකට මම මීට කලිනුත් යෝජනාවක් ගෙනාවා. මේ ඇළ වෙනස් කිරීම නිසා කන්දට වතුර ටික අරගෙන යනවා. වෙල ගොඩ කරලා තියෙනවා. ඒ මනුස්සයාට ගිහින් කිව්වම සභාවෙන් අනුමත කරලා තියෙනවා කියලා ඒක ගෙනල්ලා පෙන්වනවා. කඳු මුදුණට දැන් වතුර ටික ගෙනියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම දේකට අනුමත කරනවාද, ඇළ මාර්ග වෙනස් කිරීම් සම්බන්ධව සැලසුම් කමිටුවෙන් අනුමත කරන්නේ නැහැනේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අනුමත කරලා තිබුණා. දිනූෂ මහතා මට කතා කරහම ඒක කිව්වා. එයා දැක්කේ නැහැ කිව්වා කැලේ වැව්ලා හින්දා ඇළක් තියෙනවා කියලා. ඇළ වෙනස් කරන්න අනුමත කරලා තිබුණා. මම ඒ කාලෙත් මේක පෙන්නුවා. අබේසේකර මන්ත්‍රීතුමත් මේක දැක්කා. දැන් මේ කන්දට වතුර පාර ගෙනිහිල්ලා තියෙන්නේ. ඒ කියන්නේ මේ මනුස්සයාගේ ඉඩම මැදින් ඇළ මාර්ගය ගියේ. දැන් ඉඩම මායිමට ඇළ මාර්ගය ගෙනිහිල්ලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉඩම අනුමත කරන්න ඇති ඇළ තියෙන එක පෙන්වන්නේ නැතුව. ඒක තමයි වෙන්න ඇත්තේ. ඒක අවලංගු කරලා දාන්නම් එහෙමනම්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** තියෙන ආකාරයෙන් ඇළ මාර්ගය තියෙන්න ඉඩ හැරියම හරි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි. සභා තීන්දුව ගමු. ඒක කමිටුවට දාලා බලන්න මොකක්ද වුණේ කියලා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** අබේසේකර කමිටුවටත් දාන්න.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මෙතුමා ඒ කමිටුවේ සාමාජිකයෙක්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ අහන්න. ඒක මගේ කමිටුව නෙමෙයි. සභාපතිතුමා තමයි ඒ කමිටුව පත් කරේ. ඒක විහිළුවට ලක් කරන්න එපා හැම තිස්සේම. ඔබතුමා විහිළුකරන්න ඕන ඒවා, එපා ඒවා තියෙනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඒක විහිළුවට කිවුවේ. ඒක ගණන් ගන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 10.** ගල්කැටියවත්ත ස්වර්ණලතා මහත්මියගේ නිවස අසළ මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 11.** ගැමුණු මාවතේ පළමු අතුරු මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 12.** වල්පොලගේ වත්ත මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-13.** බෝගහවෙල්ල හරහා ලබුදූව දක්වා ගලා බසින අතුරු ඇළ මාර්ගය අවහිරවීම නිසා ප්‍රදේශයේ ගොවිතැන් කටයුතු සිදුකරන වගාබිම් පමණක් නොව නිවාස පවා ජලයෙන් යටවන තත්ත්වයක් බවට පත්ව ඇත. එම නිසා කඩිනමින් ඇළ මාර්ගය පිරිසිදු කරන ලෙසට දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත සහ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව වෙත දන්වා යැවීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අර වැලිකැටිය වත්ත මාර්ගයේ ගල් බැම්ම දාන එකේ වැඩේ කොහොමද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට ඇස්තමේන්තු සකස් කරන්න කියලා කියන්න තාක්ෂණ නිලධාරීට.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඇස්තමේන්තුව සකස් කරලා තියෙනවා. ඒකට ලක්ෂ 35 ක් යනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලක්ෂ පහකට විතර වෙන්න වගේ ඇස්තමේන්තුවක් සකස් කරන්න කියලා කියන්න.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඒක ඉක්මනට සකස් කරා නම් හරි. පාර තවත් ගිලා බැහැලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා තාක්ෂණ නිලධාරීට කියන්න මාත් එක්ක කතා කරන්න කියලා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ ප්‍රාදේශීය සභාවට අපි මුලින්ම පත් වෙලා එනකොට සම්බන්ධීකරණ කමිටුවට අපේ ඕනම මන්ත්‍රීවරයෙක්ට සහභාගි වීම සඳහා අවස්ථාව තිබුණා. ඊට පස්සේ ගිය ආණ්ඩුව කාලේ එක් පක්ෂයකින් එක මන්ත්‍රීවරයෙකුට විතරයි සහභාගි වෙන්න හැකියාව ලැබුණේ. දැන් හැබැයි මේ කාලය ඇතුළත ඒකට සහභාගි වෙන්න කියලා අපි කාටවත් දැනුම් දුන්නේ නැහැ. මොකද අපි බලාපොරොත්තු වන්නේ මෙහෙමයි. සභාවේදී අපිට යම් දෙයක් කර ගන්න බැරි වුණත් මන්ත්‍රීවරයෙකුට අවස්ථාවක් තිබුණා සම්බන්ධීකරණ කමිටුව හරහා ගමේ තියෙන ප්‍රශ්නයක් කතා කරලා බේර ගන්න. හැබැයි ඒ තත්ත්වයන් මේ ක්‍රමය යටතේ අහිමි වෙලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා මෙහෙමයි. තාම එක සම්බන්ධීකරණ කමිටුවයි තිබුණේ. ඒ තිබුණෙත් සංවර්ධන කමිටුවක්. ගම සමග පිළිසඳරක් වැඩසටහනේ යෝජනා තීරණය කර ගන්න තිබුණ රැස්වීමක් ඒක. ඒක සම්බන්ධීකරණ කමිටුවක් නෙමෙයි. සංවර්ධන යෝජනා තීරණය කර ගන්න තිබුණ රැස්වීමක් ඒක. සම්බන්ධීකරණ කමිටුවට මන්ත්‍රීවරු ඔක්කොමව කැඳවාවි. එහෙම විරෝධතාවයක් නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, සම්බන්ධීකරණ කමිටුව එදා තිබුණේ. ඔබතුමාට ඒක දන්වලා තිබුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අහන්නකෝ. මෙහෙන් නම වරද්දලා එවලා තිබුණේ. ඒත් තිබුණේ සම්බන්ධීකරණ කමිටුව නෙමෙයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කොහොම හරි මම ඇත්තටම එවෙලේ කිවුවෙත් ඒකයි. දැන් මේ බෝපෙ පෝද්දල වරිපනම් ගෙවන ජනතාව නියෝජනය කරමින් තමයි අපි මේ ඉන්නේ. මේ කරන දේවල් වලදී ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ව දැනුවත් කරන්න. දැන් මෙතන ගොඩනැගිල්ල විවෘත කරා. ඇත්තටම අපි එක කණ්ඩායමක්. අපි ඔබතුමන්ලාගේ පක්ෂයේ නෙමෙයි කියලා එහෙම එකක් නැහැ. අපිවත් මේ වගේ දේවල් වලට දැනුවත් කරන්න. ඇමතිතුමා එනවා නම් ඒ කරන සාකච්ඡා වලදී ඇත්තටම අපිත් හිටියා නම් අදහස් දක්වනවා. අපි කියන දේ කරන්න ඕන නැහැ. හැබැයි අපිටත් අදහස් දක්වන්න පුළුවන්. දැන් හෝළුවාගොඩ කරන සංවර්ධන ව්‍යාපෘතිය හොඳයි. හැබැයි අපිටත් තියෙනවා වෙනත් අදහස්. සමහර වෙලාවට ගරු සභාපතිතුමා ඒ අදහස් වලටත් යම් ඉඩක් හම්බවෙවි එතන ඉඳගෙන පොඩි අදහස් දැක්වීමක් කරන්න පුළුවන් වුණා නම්. ඒක හින්දා ඔබතුමා ඇමතිතුමාටත් ඒක කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට අබේසේකර මන්ත්‍රීතුමා ඔබතුමත්, ඇමතිතුමාට කතා කරන්න. ඒක අපි කරන වැඩක් නෙමෙයි. ඇමතිතුමා සම්බන්ධව සංවිධානය කරන රැස්වීම් ගැන දැනුම් දෙන්නේ එහෙන් මන්ත්‍රීවරුන්ට. මම නෙමෙයි ඒක කරන්නේ. ඔබතුමන්ලා ඒක දැනුවත් කරන්න කියලා කියන්න. මාත් ඒක දැනුවත් කරලා තියන්නම්. අබේසේකර මන්ත්‍රීතුමා ප්‍රායෝගිකව පොඩි ගැටළුවක් තියෙනවා. මන්ත්‍රීවරු විසි දෙදෙනෙක් ඉන්නවා. එහෙම වුණාම ඒ තැනට මේ වර්තමාන ප්‍රශ්නයත් එක්ක ඒක කරන්න බැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එක්සත් ජාතික පක්ෂයේ අපි හිටපු ආණ්ඩුව තිබුණ කාලයේදීත් මම ඒ මතයේ එදත් හිටියා. ඒ කරපු වැරැද්ද තමයි සියළුදෙනා නොකැඳවීම. හැබැයි සියළු දෙනාම කැඳවලා රැස්වීම් කිහිපයක්ම තිබුණා. මොකක්වත් වුණේ නැහැ හැබැයි. කොරෝනා කතාව බාධාවක් කර ගන්න එපා. එතකොට රැස්වීම් තිබුණානේ. ඒක වැරැද්දක්. හැබැයි ඒ වැරැද්දම දැනුත් කරනවා. එදා ඒක එහෙම තිබ්බේ වෙන දේකට නෙමෙයි. එදා එහෙම කරේ යම් යම් දේවල් ආවම ඒක යට යන්න ඕන හින්දා. මේ පක්ෂයේ හිටියට මම ඒක කියන්න ඕන එකක්. ඒකෙදී ඔබතුමන්ලාගේ මතයේ මමත් එදා හිටියා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සම්බන්ධීකරණ කමිටුව තියන කොට ඒක මන්ත්‍රීවරුන්ට කියාවි. ඒක මම නෙමෙයි තීරණය කරන්නේ. ඒක තීරණය කරන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්. ඒක මමත් ඇමතිතුමාට කියන්නම්. ඒක ගැන මන්ත්‍රීවරුන්ට කියාවි. ඒක මන්ත්‍රීවරුන්ට නොකිය ඉන්න එකක් නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මට කිවුවා ඉස්සරහට තියෙන ඒවා කියනවා කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එදා තිබුණ සම්බන්ධීකරණ කමිටුව ගැන ඔබතුමාට දැනුම් දුන්නා කිවුවා මන්ත්‍රීවරුන්ව දැනුවත් කරන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැ. මට දැනුම් දුන්නේ යෝජනා ගන්න කොට්ඨාශ මන්ත්‍රීවරුන්ව සම්බන්ධ කරන්න කියලා, යෝජනා පෙළ ගස්වලා ග්‍රාමසේවා වසම්වල රැස්වීම් තියන්න දින දා ගන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා ඊට දවස් දෙකකට ඉස්සෙල්ලා මළ ගෙදරකදී මට හමු වුණා. එදා රෑ මම ඇහුවා මේ ගැන ඔබතුමාගෙන්. ගම සමඟ පිළිසඳරක් වැඩසටහන ගැන කිවුවේ එතකොට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං ඒකට තමයි මේක තිබුණේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඇහුවම කිවුවා සම්බන්ධීකරණ කමිටුව තිබුණේ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා ඒක මට අදාළ කාරණාවක් නෙමෙයි. ප්‍රාදේශීය ලේකම් තමයි සම්බන්ධීකරණ කමිටුව කැඳවන්න ඕන. ඒක මම කරන දෙයක් නෙමෙයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක හරි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් කිවුවේ ඇමතිතුමා මේක ගැන දැනුම් දුන්නේ දවස් දෙකකට කලින් නිසා ඔක්කොටම දැනුම් දෙන්න අවස්ථාවක් නැහැ කියලා. එහෙත් සභාපතිතුමාට දැනුම් දුන්නා කියලා කිවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට දැනුම් දුන්නේ අර විදියට. බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයිති කොට්ඨාශවල මන්ත්‍රීවරුන්ව දැනුවත් කරන්න කියලා කිවුවා. ගම්වල රැස්වීම් තියන්න දින තීරණය කර ගත්තා. ඒක තමයි මට කිවුවේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සංවර්ධන කමිටුවක් තිබුණේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අදහස් දැක්වීමේ වරදක් එතන තියෙන්නේ. සම්බන්ධීකරණ කමිටුව නෙමෙයි තිබුණේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගාල්ල, කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබුණේ සංවර්ධන කමිටුව කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මමත් කතා කරලා ඇහුවා ඇයිද කියලා මන්ත්‍රීවරුන්ව කැඳවන්නේ නැත්තේ. ඕක ගැන කතා කරලා වැඩක් නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ ආණ්ඩුව පත් වෙලා දැන් මාස කීයක් වෙනවද, දැන් අවුරුද්දකට කිට්ටුයි. එතකොට දැන් මේ සම්බන්ධීකරණ කමිටුව එක දවසක්වත් පවත්වලා නැහැ මෙතෙක්. සම්බන්ධීකරණ කමිටුව පවත්වපු විදියට අපි යහපාලන ආණ්ඩුව විවේචනය කරා අදාළ මන්ත්‍රීවරු කැඳවන්නේ නැති එක සම්බන්ධව. එහෙම කරේ මන්ත්‍රීවරුන්ට අවස්ථාව දෙන්නේ නැති නිසා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඔබතුමා එදත් කෑ ගැහුවා ඕකට.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** යහපාලන ආණ්ඩුවේ හිටපු පාර්ශවකරුවන් පිළිබඳව දැනුවත් කිරීමක් කරන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ පාර්ශවකරුවන් මේ ආණ්ඩුව හදන කොටත් හිටියා. ඒ පාර්ශවකරුවන්ම තමයි දැන් ඉන්නෙත්. දැනුත් එකතු වෙලා ඉන්නේ ඒ අයම තමයි. ඒ නිසා ඒක සම්බන්ධව කිසි ගැටළුවක් නැහැ. අපේ විවේචනය තිබුණේ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහය නැති කරපු එක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා ඒ කාලේ කොරෝනා තිබුණේ නැහැනේ. දැන් කැඳවීමේ ප්‍රශ්නයක් තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපිට මීටරයේ දුර හරි තියෙනවා. දැන් තියෙන රැස්වීම් වලට මීටරයේ දුරවත් නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලංකාවේ කොහේවත් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් තියන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ රටේ මිනිස්සු ඇස් දෙකට ඒක දකිනවා. මේ මිනිස්සුන්ගේ ඇස් දෙකට බොරු කරන්න ඔබතුමාට බැහැ. මීටරයක් නෙමෙයි සෙන්ටිමීටරයේ දුරක්වත් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට මාසිකව සම්බන්ධීකරණ කමිටුව තිබුණ තැනක් කියන්නකෝ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සම්බන්ධීකරණ කමිටුව තියන්න ඕන අපි නෙමෙයිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ලංකාවේම තියන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමන්ලාගේ ආණ්ඩුව එපැයි ඒක තියන්න.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඉදිරියට ඔක්කොටම කියනවා නේද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනිවාර්යයෙන්ම කියනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** යටගියාව කතා කරන්න ඕන නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** යටගියාව කතා කරනවා නෙමෙයි මේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට හැම එකටම හේතු තියෙනවා කිතුල් ගහට නැග්ගා වගේ. ඔබතුමාට කොරෝනා හැදුණත් වැරදියි, නැතත් වැරදියි. හැදුනොත් කියාවි මොකටද රැස්වීම කැඳෙව්වේ කියලා. ඔබතුමන්ලා බොර දියේ මාලු බාන මිනිස්සු. රැස්වීම කැඳවලා කෙළවුණාම කියාවි මොකටද රැස්වීම කැඳෙව්වේ කියලා. රැස්වීම කැඳවලා කොරෝනා හැදුණම කියාවි මොකටද කියලා මේක තිබ්බේ. ඇමතිතුමාට මොලේ නැද්ද කියලා අහවි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** තමුන්නාන්සේට තියෙන උපකල්පන නෙමෙයි අපිට තියෙන්නේ. ඒවා ඔබතුමාගේ හිතේ තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙමනම් මොකක්ද කියන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපි කියන්නේ අනිත් ඒවා කැඳවන්න පුළුවන් මේක විතරයි බැරි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහෙද එහෙම කැඳවන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** රැස්වීම් පිළිබඳව පෙන්වනවා මාධ්‍යවල. ඒවා බලන්න. එක මීටරයක දුරක් නැහැ. සෙන්ටිමීටරයේ දුරකින් රැස්වීම් තියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සම්බන්ධීකරණ කමිටු රැස්වීම්ද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සම්බන්ධීකරණ කමිටුව විතරයි තියා ගන්න බැරි මීටරයේ දුර නැතුව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා මෙහෙමයි. ඇමතිතුමා එතුමාගේ සංවර්ධන වැඩ කටයුතු ටික කරගෙන යනවා. එතුමා තීරණය කරාවි සම්බන්ධීකරණ කමිටුව තියනවද, නැද්ද කියලා. මට තීරණය කරන්න බැහැ ඒක.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම කියන්නේ ඒ තීරණය තමයි ප්‍රශ්නය තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට කවදා හරි අවස්ථාවක් ආවොත් ඒක තීරණය කරන්න මම ඒක මාස්පතා තියන්නම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක තමයි මේ කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු දෙන්නව කැඳවන්නේ නැතුව හරි ඒක තියනවා. ඒක මට තීරණය කරන්න දුන්නොත් එහෙම කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක ප්‍රශ්නයක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම අදහසක් මට තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** බොහොම ස්තූතියි ඔබතුමාට. ඔබතුමන්ලා කැමතියි අපි නැතුව යන්න. රටේ ජනතාව ඒකට ඉඩ දෙනවද නැද්ද කියන එක වෙනම තීරණයක්.

(ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මට පොඩි අවස්ථාවක් ලබා දෙන්න. නරාවල මාටින් පෙරේරා මාවත සංවර්ධනය කිරීම පිළිබඳව මට පොඩි ගැටළුවක් තියෙනවා. මේ මාර්ගයේ දැන් කාපට් අතුරන්න යෝජනා කරලා වැඩ කෙරෙමින් පවතිනවා. මම හැබැයි තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ඉල්ලීමක් කරා මාර්ග සංවර්ධන අධිකාරියෙන් ඒ ඇස්තමේන්තුව ලබා ගන්න. මට ලියුමක් එවලා තියෙනවා මාර්ගයේ නම සඳහන් කරලා ඇස්තමේන්තුව සකස් කරලා අනුමැතියට ඉදිරිපත් කරා කියලා. දැන් මාස අටක නමයක කාලයක ඉඳලා මාර්ගයේ වැඩ කරගෙන යනවා. ඇස්තමේන්තුව හදලා අනුමැතියට යවලා තියෙනවා නම් මේ අනුමැතිය ලැබුණේ නැති වුණොත් මොකද වෙන්නේ කියන ප්‍රශ්නය තියෙනවා. මොකද වැඩ කරනකොට අධීක්ෂණය කරන්න මාර්ග සංවර්ධන අධිකාරියෙන් වැඩ පරිපාලක කෙනෙක් එන්නෙත් නැහැ. තාක්ෂණ නිලධාරි කෙනෙක් එන්නෙත් නැහැ. ආවත් හදිසියෙන් තමයි එන්නේ. අද සභාපතිතුමනි, මාර්ගයේ ඒ.බී.සී. ගල් එළනවා. ඒ.බී.සී. ගල් වල ගල් කුඩු නැහැ. තියෙන්නේ තුන්කාලේ ගල් විතරයි. උඩින් ගල් කුඩු දාලා, වතුර දාලා තලනවා. ගමේ මිනිස්සු මට ඇවිල්ලා කියනවා. මේක බලන්න ඕන හැමෝටම කිවුවා. මට දැන් කියලා කියලා කියන්න කෙනෙකුත් නැහැ. කවුරුවත් ඇවිල්ලා බලන්නෙත් නැහැ. මම කියන්න ඕන උපරිම තැන් වලට කියලා තියෙනවා. ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් කරනවා මේක ගිහිල්ලා බලන්න කියලා මාටින් පෙරේරා මාවතේ කොහොමද ඒ.බී.සී. ගල් එළන්නේ කියලා. එතන තාක්ෂණ නිලධාරි කෙනෙක් නැහැ. ඒ අය බලන්න එන්නෙත් නැහැ. ඒක ප්‍රාදේශීය සභාව සතු පාරක්. ඒ නිසා අපේ තාක්ෂණ නිලධාරි කෙනෙක් හරි දාලා මේක අධීක්ෂණය කරන්න. අපිට බලයක් තියෙනවා මේක අපේ පාරක් නිසා. ඒ වැඩ ටික ක්‍රමානුකූලව කෙරෙන්නේ නැහැ. කාපට් පාරක් කරාට පස්සේ අවුරුදු දහයක් විතර යනකම් මුකුත් සංවර්ධන වැඩ කටයුත්තක් ඒ පාරේ වෙන්නේ නැහැ. ඒ නිසා මේක හරියට හදා ගන්න ඕනකම තියෙනවා. ඒ නිසා මේකට ඉල්ලීමක් කරනවා. මාටින් පෙරේරා මාවත සංවර්ධනය කරන්නේ ලයනල් කියලා කොන්ත්‍රාත්කරුවෙක්. එයාගේ වැඩ ගැන හෙවුවට පස්සේ තේරෙනවා කොහොමද පාර හදලා තියෙන්නේ කියලා. ඒ නිසා මේකට බොහොම පැහැදිළිව මම කියන්නේ මේ පාර හදන විදියේ කිසිම ක්‍රමවත් බවක් පේන්නේ නැහැ. ඒ නිසා මේකට සභාව හරි මැදිහත් වෙලා මේකෙ වැඩ ටික හරියට කරලා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා. මම අද පෙන්වන්නම් ගිහිල්ලා අර ඒ.බී.සී. ගල් දාලා පාර තලපු තැන් ටික. ඒ තැන් හාරලා බැලුවම යට තියෙන්නේ නිකං ගල්. ඒ.බී.සී. නැතුව නිකං ගල් දාලා තියෙන්නේ. මට ඒක හාරාලා පෙන්වන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තාක්ෂණ නිලධාරි කෙනෙක්වත් බලන්න එන්නේ නැද්ද.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** තාක්ෂණ නිලධාරි කෙනෙක්වත් බලන්න එන්නේ නැහැ. කතා කරහම හදිසියෙන් ඇවිල්ලා බලලා යනවා එච්චරයි. කියන්න තියෙන හැමෝටම මේක ගැන කිවුවා. දැන් ගන්න හැන්ඩ් ෆ්‍රී දාලා කෝල් එකක් මාර්ග සංවර්ධන අධිකාරියට.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවක්ද දැන් තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ආණ්ඩුවේ කතාවක් නෙමෙයි මන්ත්‍රීතුමා කිවුවේ. ප්‍රශ්නයක් වුණාම අදාළ ප්‍රශ්නය ගැන කතා කරන්න ඕන. ඔබතුමන්ලා වගේ ගල් ගහ ගහ ඉන්න එක නෙමෙයි කරන්න ඕන. තියෙන ගැටළුව කතා කරලා විසඳ ගන්න ඕන ආණ්ඩුව ඇතුලේ හරි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සභාව ඇතුළේ කතා කරපු නිසයි මම ඇහුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ගේ ප්‍රශ්නයක් මෙතනදී තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක නිවැරදිව කර ගන්න මන්ත්‍රීතුමා කොහොම හරි මැදිහත් වෙලා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** අපේ සභාවේ පාරක් නම් මෙහේ තාක්ෂණ නිලධාරි කෙනෙක් හරි යවලා ඒක අධීක්ෂණය කරවන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මම දන්නේ නැහැ ජනතා විමුක්ති පෙරමුණ හිටියද, නැද්ද කියලා අවුරුදු ගාණක්. ජනතා විමුක්ති පෙරමුණට මොකක්ද වෙලා තියෙන්නේ කියලා මට හිතා ගන්න බැහැ. පහුගිය අවුරුදු පහක් ගෙවුණා. අරක කරා, මේක කරා. ජනතා විමුක්ති පෙරමුණ හිටියද, නැද්ද කියලා දන්නේ නැහැ. ඒක මම අපේ මේ මන්ත්‍රීවරු එක්කත් කතා කරා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** දැන් වැඩ කරනවා වැඩි හින්දා නැගිටලා තියෙන්නේ.

(ඊ) කාරක සභාවල වාර්තා ඃ- නැත.

(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-

01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2021 වර්ෂයේ ජනවාරි මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2021 වර්ෂයේ ජනවාරි මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2021 වර්ෂයේ ජනවාරි මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**(තේ පානය සඳහා සභාව කල් තබන ලදී.)**

(ගරු මන්ත්‍රිනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** සභාපතිතුමා, දැන් මගේ ප්‍රශ්නයට උත්තරයක් ආවේ නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ අය දුරකථනයට ප්‍රතිචාර දක්වන්නේ නැහැනේ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මට අවස්ථාවක් දෙන්න තාක්ෂණ නිලධාරිනි කමණි මහත්මියව හරි එවලා මේ ටික පෙන්වන්න. අපේ තාක්ෂණ නිලධාරිතුමියට එන්න කියන්නකෝ මම ඒ ටික පෙන්වන්නම්. ඊට පස්සේ සම්පූර්ණයෙන්ම පාර තැලුවම ඒක හොයා ගන්නත් බැහැ, බලන්නත් බැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මෙහෙම තියෙන්නේ. මේ පිළිබඳව මෙහෙම කරලා තියෙනවා කියලා දන්වන්න.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** කාටද දන්වන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මාර්ග සංවර්ධන අධිකාරියට

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** වැඩක් නැහැ. ගෙන්වලා පෙන්වලත් වෙනසක් වුණේ නැහැ. වෙනම ප්‍රශ්නයක් ඔතන යනවා.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** පළාත් පාලන කොමසාරිස්තුමාට කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම එන්නම් තාක්ෂණ නිලධාරි එක්ක බ්‍රහස්පතින්දාට ඒක බලන්න. අපි ගිහින් බලමු. මම මාර්ග සංවර්ධන අධිකාරියෙනුත් ගෙන්වා ගන්නම්.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මාර්ග සංවර්ධන අධිකාරියෙනුත් ගෙන්වා ගන්න ඕන සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බ්‍රහස්පතින්දාට ඒක බලන්න යමු.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම හිතන්නේ අද අපේ චන්ද්‍රකුමාර මන්ත්‍රීතුමාගේ උපන්දිනය යෙදිලා තියෙනවා. ඉතිං මම ගරු සභාපතිතුමාගෙත්, උප සභාපතිතුමාගෙත්, සියළුම මන්ත්‍රීවරුන්ගේත්, මන්ත්‍රීවරියන්ගේත් සුභාශිංෂන එක් කරනවා එතුමාට. ඒ වගේම එතුමාට නිදුක්, නිරෝගී සුවය ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතුමාට දැන් අවුරුදු 53 ක් වෙනවා. තව අවුරුදු 53 ක් එතුමාට ජීවත් වෙන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ස්තුතියි.

<u>04. වෙනත් ලේඛන</u> ඃ-

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වැලිපිටිමෝදර හා කුරුඳුවත්ත එළගව මස් කඩ සම්බන්ධව. (විෂය නිලධාරි, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒක සාමාන්‍යයෙන් දැන් වෙනදට ටෙන්ඩර් කරලානේ දෙන්නේ. ඒ විදියට ටෙන්ඩර් කරලා දෙන ක්‍රමයකට ඒක දෙන්න. ඒකෙ කිසි ප්‍රශ්නයක් නැහැ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** මස් කඩ අයින් කරන්න බැරිද.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අපේ සභාවෙන් වාර්ෂිකව ඒවා ටෙන්ඩර් කරානේ සාමාන්‍යයෙන් ගොඩනැගිල්ලක් ඒ අය සොයා ගැනීමේ පදනම මත. ඒ පදනම මත ඒක ලබා දෙන්න. මෙච්චර කල් කරේ එහෙමනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද මේකට කරන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මස් කඩ පිළිබඳ ප්‍රශ්නයේදී ඇත්තටම මෙතුමා එක පැත්තකින් කිවුවා මස් කඩ වහන්න ඕන කියලා. මස් කඩ වහලා දැම්මත් කමක් නැහැ. අපිට මස් ගන්න තියෙනවා කියලා කිවුවා. ඒකෙ ඇත්තක් තියෙනවා. නිල වශයෙන් කරන ඒවත් තියෙනවා, නිල වශයෙන් කරන්නේ නැති ඒවත් තියෙනවා. කියාස් මන්ත්‍රීතුමන්ලාට ඒකෙ ප්‍රශ්නයක් නැහැ. හැබැයි එකක් තියෙනවා. ඔබතුමත් ඒක දන්නවා ඇති. අපේ මස් කඩයක් තියෙනවා නම් ඇරෙන්න, අපේ මස් කඩයක් බදු දීලා තියෙනවා නම් ඇරෙන්න අපිට ඒ අයගෙන් ටෙන්ඩර් කරලා බදු ගන්න අයිතියක් නැහැ. කුකුල් මස් විකුණනවා වගේම තමයි මේ මසුත් විකුණන්නේ. ඒක හින්දා අපිට එහෙම අයිතියක් නැහැ. ඒ අය නීතිය ඉදිරිපිටට ගියොත් අපි අමාරුවේ.

ඊළඟට එකක් තියෙනවා අපි මහා පසුගාමී තැනකට යන්න ඕන නැහැ. අපි මොන තරම් කිවුවත්, හොරාට හරි හරක් මරනවානේ. ඒක හින්දා මේවා නීත්‍යානුකුලව තියෙන, විද්‍යානුකුල ක්‍රම අනුව යන්න ඕන දේවල්. අපේ රටේ නීතියක් විදියටම ගෙනල්ලා මේවා තහනම් කරොත් එතකොට ඒක ක්‍රියාත්මක කරන එක වෙනම කතාවක්. ඒකෙදී එකක් තියෙනවා මස් කන කට්ටිය කාවි. මස් නොකන කට්ටිය නොකා ඉදීවි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට බැරිද කියාස් මන්ත්‍රීතුමා මේකට තැනක් බද්දට ගන්න. මේක සභාවට ලැබෙන්න ඕන මුදලක්නේ. ඒක තමයි මේ නොලැබී යන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාවේ තැනක් තියෙනවා නම් මේක කරන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අපිට ඒකට තැනක් හොයා ගන්න පුළුවන්. ඒක බැරිකමක් නැහැ. පොඩ්ඩක් උනන්දු වෙලා කඩයක් හොයා ගෙන ඒක සභාවට බද්දට ගමු. කඩවල් දෙකක් දෙපැත්තෙන් හොයලා ගමු.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඔය මස් කඩ තහනම් කරන්න බැරිද බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ. සියළුම මස් කඩ තහනම් කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කඩයක් බද්දට අරගෙන මේකට ටෙන්ඩර් කරමු.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එහෙම ක්‍රමයකට කරමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඊළඟට මේවාට පොඩි සහනයක් ලබා දෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉස්සෙල්ලා මූලික ප්‍රශ්නය විසඳගෙන ඉන්න ඕන. අපි ගයන්ත මහත්තයාව සම්බන්ධ කරලා ස්ථානයක් කතා කර ගමු.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ස්ථාන දෙකක් අපි තෝර ගමු. ඊට පස්සේ ටෙන්ඩර් කරමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම කරමු.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මස් කඩ සම්බන්ධව කතා වුණානේ ගිය සභාවේදී.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභා වාර්තාවේ සංශෝධන වලට එන්න ඕන එකක් මේ. දැන් සංශෝධන ඉවරයි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒකෙදි මෙතන ''සම්පූර්ණයෙන්ම වහලා දාන්න ඕන කියලා'' සඳහන් වෙනවා. මම නම් ඇත්තටම ඒකට විරුද්ධ වුණේ නැහැ. මම විහිළුවට කිවුවා මෙතුමාට ඔච් ඉතිං සම්පූර්ණයෙන්ම වහලා දැම්මම ඉවරයිනේ අපි මස් කන්නේ නැතුව ඉන්නේ නැහැනේ කියලා. මේකෙ මම කඩේ වහලා දාන්න කිවුවා කියලා සඳහන් වෙනවා. ඒක නිසා මේක පොඩ්ඩක් නිවැරදි කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කඩේ වහලා දාන්න කියලා කිවුවා. අපිට මස් කන්න පුළුවන් කියලා කිවුවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අපි මේක වහලා දැම්මා කියලා මස් කන්නේ නැතුව ඉන්නේ නැහැනේ කියලා කිවුවේ.

**(ඌ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා**

**පසුගිය මහා සභා රැස්වීම් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවල ප්‍රගතිය සමාලෝචනය**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2021 වර්ෂයේ පෙබරවාරි මස මහා සභාවට ඉදිරිපත් කරන ප්‍රගතිය සමාලෝචනය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම හිතන්නේ ඇත්තටම අපි ප්‍රගතිය පිළිබඳව ගත්තම දැන් ඩිංග ඩිංග හරි ඉස්සරහට යනවා. නමුත් එකක් තියෙනවා දැන් දිගින් දිගටම සිදු වෙන. අපි ඉල්ලන දේවල් මේ නිලධාරි මහත්වරු ඉදිරිපත් නොකිරීමේ අවස්ථාවක් තමයි බැලුවම තියෙන්නේ. ඒක අපි බොහොම පැහැදිළිව කියලා තියෙනවා. අපිත් එක්ක ක්ෂේත්‍ර පරීක්ෂණයකට මේ අය ගියා. ඔබතුමාට එදා යන්න වුණේ නැහැ. ඒ පෙන්වපු ස්ථාන පිළිබඳව අපි වාර්තාවක් ඉල්ලුවා. අද තව වෙනකම් ඒක හම්බ වුණේ නැහැ. හේතුව එතුමන්ලා, එතුමියන්ලා දෙගොල්ලෝ අමාරුවේ වැටෙන තැනකට යන්නේ ඒකෙන්. මොකද හේතුව ඇත්තටම ඒ අයට වැඩක් නැතුව ප්‍රශ්න දා ගන්න තැනකට ඇවිල්ලා ඉන්නේ මට පේන විදියට ඒ නිලධාරි මහත්වරු. ඒ කියන්නේ ඒක ඔබතුමන්ලාගේ වරදක් නෙමෙයි. සැලැස්මක් දීලා තියෙනවා නම් එන්.බී.ආර්.ඕ. එක මේ විදියට කපන්න ඕන කියලා, ඒක ඒ විදියට කරන්න ඕන. එහෙම නැත්නම් එන්.බී. ආර්.ඕ. එකෙන් අවසර අරගෙන නැත්නම් ඒ වැරදි ඒ අයගේ අතින්නේ වෙන්නේ. එතකොට ඒ කියපු විදියට නොකර තියෙනවා නම් ඒවා පිළිබඳව තියෙන ප්‍රශ්න තියෙන්නේ ඔබතුමන්ලාට නෙමෙයිනේ. ඒ හින්දා දිගින් දිගටම මේ ප්‍රශ්නය පහු කිරීමේ තත්ත්වයක් අපිට පේනවා බොහොම පැහැදිළිවම. දිගින් දිගටම ඒක අපි ඉල්ලුවා. දැන් මාස දෙකකටත් වැඩියි ඒකට. 2017 වර්ෂයේ ඉඳන් ඉල්ලන ඒවා තියෙනවා. අර තට්ටු තුනේ ගේ පිළිබඳව කියන්නේ. ඒ වගේම ගෙයක් තමයි අර එහා පැත්තෙත් හදාගෙන යන්නේ. කොයි වෙලාවක හරි ඒක නාය යාවිද දන්නේ නැහැ. අපි සන්තෝෂ වෙන්න ඕන ගොඩකන්දේ ස්ථානය පිළිබඳව. ඒකට යම් ක්‍රියාමාර්ගයක් අරගෙන තියෙනවා. ඒ වැරැද්ද නිවැරදි කරන්න හරි ඒක කඩලා පැත්තකට කරනවා. ඉතිං මේ විදියට නාවොත් ඇත්තටම, මේක මේ විදියට දෙන්නේ නැත්නම්, තරහා ගන්න එපා. අපිට ඉස්සරහ සති දෙක ඇතුළත මේ වාර්තාව ඉදිරිපත් කරන්නේ නැත්නම් අපි පෞද්ගලිකව හරි ගිහිල්ලා නඩුවක් දානවා. මොකද අපි දැන් මේක ගැන දිගින් දිගටම කියලා තියෙනවා මේ සභාවේදී. මේක ගෙනත් දෙන්නේ නැහැ කොහොමවත්. එතනින් ගියාම ගරු සභාපතිතුමා ජල සම්පාදනයට යන පාරේ තියෙන තරංගා ලෑන්ඩ්ස් එකේ ඉඩමේ දැන් ආයෙම බෝඩ් ගහලා වෙන්දේසියට දාලා තියෙනවා. මම ඒකෙ විස්තර ටික ඔබතුමන්ලාට දෙන්නම් බොහොම පැහැදිළිවම. ඒක මේ සභාවේ වැරැද්දක් නෙමෙයි. ඒක කෙලින්ම නාගරික සංවර්ධන අධිකාරිය කරපු එකක්. නාගරික සංවර්ධන අධිකාරියෙන් ඒක කරලා තියෙන්නේ ඒ ස්ථානයටවත් ගිහිල්ලා බලලා නෙමෙයි. ඒ අයට දෙනවා පරිසර නිර්දේශ ගන්න යූ.ඩී. ක්ලියරන්ස් ගන්න කියලා. මේක පහත් බිමක්ද කියන එක බැලුවේ නැහැ. ඒ වගේ මට්ටමට ගිහිල්ලා තියෙන්නේ. ඉතිං එකක් තියෙන්නේ මේ ඔක්කොම ඔබතුමන්ලාට කර ගන්න වෙලා තියෙන්නේ. මේ අය කරන වැරදි ටික මේ. ඒක නිසා සැලසුම් කමිටුව මේ කරන වැරැද්ද පිළිබඳව අපිට කවුද වගකියන්න ඕන නිලධාරීන් කියලා ඒවි. මේකට නැත්නම් අපිට පෞද්ගලිකව හරි ඇත්තටම නීතිමය ක්‍රියාමාර්ග ගන්න සිද්ධ වෙනවා. කොච්චර ඉල්ලුවත් මේ අය ඒක දෙන්නේ නැහැ. අපි පෞද්ගලිකව දන්න හිතවත් අය මේ ඉන්නේ. ඔබතුමන්ලා අමාරුවේ වැටෙන්න එපා මේකෙදී. ඒකයි මේ කියන්නේ. මේ ටිකට ඔබතුමන්ලා සැලැස්මක් දීලා ඇති. ඒක

එක්කෝ බලලා නැතුව ඇති. ඒ අඩුපාඩුව දැන් හරි නිවැරදි කරන්න. මේකෙ ප්‍රගතිය පිළිබඳව අපිට දන්වන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇත්තටම මම මේකත් විවෘතව කියන්න ඕන කතාවක්. දැන් පහුගිය කාලයේදී ඔබතුමන්ලා කණ්ඩායමක් විදියට කමිටුවක් පත් කරලා ඒකෙන් ගිහිල්ලා බලලා ඇවිල්ලා තිබුණා ස්ථාන 13 ක්. ලීඩ්ස් එකත් එක්ක 14 යි. ඒ එකක්වත් මගේ කාලයේදී වෙච්ච දේවල් නෙමෙයි. නමුත් මම හොඳටම දන්න මන්ත්‍රීවරු කිහිපදෙනෙක්ව ඒ අය හමුවෙලා තිබුණා. මට පට්ට පතුරු යන්න බැනලා තිබුණා. මම කොහේවත් නැති, කලින් නොකරපු එකක් දාගෙන අන්තිමට සමහරු හොඳ වෙනවා. කෙලින්ම මම නරක මිනිහා වෙන්නේ. බොහොම වැරදි මතයක් ඒ මිනිස්සු අතර නිර්මාණය කරනවා. මේ සභාපතිගේ බලතල. එයා කරන්න ඕන දේවල් මේ. එයා මේවා කරන්නේ නැහැ කියලා ඒක කෙලින්ම මගේ පිට දානවා. හොඳ ටික තමන්ගේ ගොඩට දා ගන්නවා. මාත් බලාගෙන හිටියේ සුගත් මන්ත්‍රීතුමා තේරුණාද, දැන් වෙලා තියෙන්නේ මෙහෙමනේ. නඩු වැටෙන කොට මිනිස්සු දැන් මට කතා කරා. මම කිවුවා ඒවාට නඩු වැටෙනවාම තමයි කියලා. මට මුකුත් කියන්න බැහැ, ඔයාලට මේවාට කාලයක් දුන්නා කියලා මම කිවුවා. නමුත් බොහොම පැහැදිළිවම මට කතා කරලා ඒ අය මේ දේවල් කියනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් මේ අයට වැරදි චිත්‍රයක් දෙනවා. මාවත් හමුවන්න ආවා. බොහොම පැහැදිළිවම මම කිවුවා මේකෙ ප්‍රගතියක් නැති තත්ත්වයක් තියෙන්නේ කියලා. ඔයගොල්ලන්ට වෙච්ච අසාධාරණයක් තියෙනවා නම් ඒ අසාධාරණය කියන්න කිවුවා සභාවට.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** හැමකෙනාටම ඕන විදියට මේකෙ අනවසර ඉදිකිරීම් කරන්න ඉඩ දෙන්න බැහැ.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** සභාපතිතුමා ඉල්ලගෙන කෑවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමා ඉල්ලන් කෑවා කියලා මෙතුමා කතා කරන්නේ. අර බංගලාවත්තේ බැම්මත් අපි කැඩුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැ. මම ඉන්න ස්ථාවරය නම් දැන් මේකෙදී මේ දහනායක කියන්නේ අපි ඉස්සර ඉස්කෝලේ යන කාලේ ඉඳන් දන්න කෙනෙක්. ඒ කෙනාටත් දැන් නඩුවක් දාලා තියෙන්නේ. ඊට පස්සේ මෙතන තියෙන එක. ඒ අය මගෙන් අහනවා මට මොකක්ද තියෙන ප්‍රශ්නය කියලා. ඒ අය කියනවා මගේ කාලයේදී නෙමෙයි මීට ගොඩක් කලින් අහවල් සභාපතිතුමාගේ කාලයේදී තමයි මේවා කරේ කියලා. මම කිවුවා දැන් මමනේ සභාපතිකම කරන්නේ කියලා. එහෙම කියනවා. ඒ මිනිස්සු ගිහිල්ලා සමහර මන්ත්‍රීවරුන්ව හම්බවුණාම කියනවා මේ සභාපතිතුමා තමයි මේවා කරන්නේ, ඌ දැන ගන්න ඕන, මාව බල්ලට දාලා කතා කරන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමා ඕක චෝදනා කරලම කියන්න. කමිටුවක් හැටියට එහෙම කරනවා නම් ඒක වැරදියි. ඒ කියපු කෙනා කවුද කියලා කියන්න. මේ කමිටුවේ මමත් ඉන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට රෙකෝඩින් ගෙනල්ලා දාලා පෙන්වන්නම් කිවුවා කතා කරපු විදිය. කතා කරපු විදිය මම කියන්නම්. මම ඕනනම් මූණටම තියලා අහන්නම් කියපුවා. මොකද මේ කොහේවත් නැති ඒවාට මම බලයක් දීලා මම නිකං මේ එක එකාගෙන් බැණුම් අහනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මෙතන ගැටුමක් ඇති කරනවා එහෙම කියලා. මාව හම්බවෙන්නනම් කිසිම කෙනෙක් ඇවිල්ලත් නැහැ. ඒ වගේම තමයි කමිටුවක් විදියට වැඩ කරලා සභාපතිතුමාට හෝ කමිටුවේ ඉන්න කෙනෙකුට එහෙම චෝදනාවක් කරනවා නම් ඒක වැරදියි. ඒ කෙනෙක් සභාපතිතුමාට හරි, අරයට මෙයාට හරි පුද්ගලිකව එහෙම කතා කරනවා නම් ඒකත් වැරදියි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එහෙම කියපු ගමන් මම දැන් ගෙන්වලා අහනවා කියන්න කෙලින්ම.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එවෙලෙම ගෙන්වන්න. මෙන්න මෙයා මේක කරනවා කියලා කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මෙහෙමයි ඉතිං. ඒ අය බලන්නේ මේකට කවුරු හරි ළඟට ගිහිල්ලා ඉවරයක් කර ගන්න, බේර ගන්න. ඉතිං ඒක ඒ මිනිස්සුන්ගේ පැත්තෙන් හරි. නමුත් ගියාට පස්සේ කරන්නේ සමහරු නිර්දෝෂී, මම වැරදියි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එහෙම කියපු ගමන් මම දැන් අහනවා කියලා කතා කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම හිතන් ඉන්නේ ඔය 14 ඔහොම යද්දාවේ. අනිත් ඒවාගෙන් මගේ කාලයේ වෙච්ච ඒවාට විතරයි කරන්නේ. ඒවා මගේ කාලයේ වෙච්ච ඒවා නිසා. මොකටද මන්ත්‍රීතුමා අනිත් අයගේ පවු මම කර ගහන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමාගේ කාලයේ දැන් අපි කරන්න ඉඩ දෙන්නේ නැහැනේ. වඩා වැදගත් වෙන්නේ ඔබතුමන්ලා අපි අත්සන් කරපු ලියුම්වල දේවල් වලට දැන් ක්‍රියාත්මක වීම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා ඔය කියන සුන්දර කතා නැහැ ඒ මිනිස්සු තමන්ගේ ළඟට ආවම කතා කරන විදිය බැලුවම. මෙතනදී බොහොම විනීතව සභාපතිතුමා ඔබතුමා නිවැරදියි කියලා කතා කරනවා. නමුත් මිනිස්සු අසරණ වෙලා හිරවුණාට පස්සේ මගේ ළඟට එනකොට කෙලින්ම ඒ චෝදනා මට දානවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එහෙම කියපු ගමන් ඉක්මනට කතා කරන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා දැන් අපි ඇත්තටම කමිටුවක් විදියට රැස්වෙලා මේ ගනිපු තීන්දුවක ප්‍රතිඵල තමයි මේ එන්නේ. මේක බෝපෙ පෝද්දල ජනතාවගේ යහපත තකා තමයි දැන් ක්‍රියාත්මක වෙන්නේ. ඉස්සරහටත් මේක එනවා. දැන් මේ ආරංචිය ගියාම ඔය අනවසර ඉදිකිරීම් කරන මිනිස්සු මේකට යම්කිසි ක්‍රියාත්මකවීමක් වෙනවා. එහෙම බයකුත් ඒ අයට ඇති වෙනවා. කුලප්පු වෙන අයත් ඉන්නවා. ඒ අය කුලප්පු වුණත් මෙතන මොකක් හරි තියෙන්න ඒක අපි කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මෙහෙමයි සුගත් මන්ත්‍රීතුමා. දැන් මම අහන්න කැමතියි අපි නඩුව දැම්මනේ දහනායකට. දැන් ඉතිං ඔයගොල්ලෝ අපෙන් අහනවා වගේම බලන්න ඉතුරු ටිකත් ගොඩකරලා තියෙනවා මේ සතිය ඇතුළත. සතියට ඒක ගොඩකරලා තියෙනවානේ. දැන් ඒවත් බලන්නකෝ. අදාළ ආයතන වලට ගිහිල්ලා කියන්නකෝ. දැන්වත් ඒක කතා වුණේ නැහැනේ. මම කියන්නේ දැන්වත් ඒක ගැන කතා වුණේ නැහැනේ. මම කතා කරා ගොවිජන සේවා එකට තුන්පාරක්. දැන් ඔබතුමන්ලා ඒවාට මුකුත් කතා කරන්නේ නැහැ. ඒවා එපැයි කතා කරන්න. ඔබතුමන්ලා උද්ඝෝෂණය කරන්න ඕන ඕවට විරුද්ධවනේ. වැඩක් නැහැ. අපි නඩු දාලා තියෙන්නේ ඉදිකිරීමට. කුඹුර ගොඩ කිරීමට නෙමෙයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් කුඹුර තිබුණට වැඩිය හොඳට ගොඩ කරලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තමයි කියන්නේ. අපි නඩුව දැම්මේ ඉදිකිරීමට විරුද්ධව. නමුත් දැන් නඩුව යන අතරේ තිබුණට වැඩිය තුන් ගුණයක් විතර ගොඩ කරලා තියෙනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒක තමයි අපි කියන්නේ. මේවායේ ප්‍රතිඵල අපිට එන්න ඕන. දැන් ඒකට අපි නඩු දාලා තියෙනවා. නඩු වලින් ප්‍රතිඵල එනකොට අපි තීන්දුවක් ගමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැ. ප්‍රතිඵලය විදියට ඒවි අනවසර ඉදිකිරීම කඩා ඉවත් කරන්න කියලා. එතකොට කුඹුර ගොඩ කරපු ඒවාට තීන්දුවක් එන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක කුඹුරක් කියලා කියන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට ගොවිජන සේවා එකෙන් නඩු දාන්න ඕන.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඉතිං ඒ අයව දැනුවත් කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැනුවත් කරා. කවුද නඩු දාන්නේ. ලිපිගොනුව යට ගහනවා හැමදාම.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මේ කමිටුවේ සාමාජිකයෙක් විදියට දැන් චෝදනා එල්ල වෙන කොට අපිත් ඒකෙ කොටස්කරුවෝ වෙනවා. කවුද කියලා නම් කියවෙන්නෙත් නැහැනේ. නමුත් මෙතන දැන් මන්ත්‍රීවරු විදියටත් කියනවා ඔබතුමා ඉල්ලාගෙන කෑවා කියලා. ඔබතුමා සද්භාවයෙන් මේ කමිටුව පත් කරේ. එතකොට ඒක ඉල්ලන් කෑවේ නැහැ. මේවා දැහින් දැකපු මන්ත්‍රීවරු ඉන්නවා. මේ අයට කියන්න පුළුවන්ද කමිටුව විදියට බොරු චෝදනාවල් ඉදිරිපත් කරලා තියෙන්නේ කියලා. ඒක නිසා එවැනි චෝදනා කරන්න එපා. ඔබතුමන්ලාගේ සභාව රැකෙන්න මේවා දිගින් දිගට යන්න ඕන. දැන් මේවා නැවතිලා තියෙනවා. ඒක නිසා එහෙම කතා කරන්න එපා. දැන් ඔබතුමා කිව්වා ගෙවල්වලට ආවම අරහෙම කියනවා කියලා. ඒ අයට හිතලා මතලා ඕන දෙයක් කියන්න පුළුවන්. පුළුවන්නම් ඒවා රෙකෝඩින් දාන්න. මම දැන් කියනවා සභාවේ කියපු නිසා, මම ඔය කිසි පුද්ගලයෙක් එක්ක පෞද්ගලිකව ඇයි හොඳයියක් නැහැ වචනයකින්වත්. හැබැයි අර දහනායක කියන මනුස්සයා එක දවසක් ඇවිල්ලා තිබුණා මාව හමුවන්න. මම ගෙදර හිටියේ නැහැ. ඊට පස්සේ දවසක ආවා. ආවේ මෙතුමන්ලාගේ ඥාති පුත්‍රයෙක් එක්ක. ඇවිල්ලා හමුවුණාම මම ඇහුවා මොකද කියලා. මෙන්න මෙහෙම ප්‍රශ්නයක් තියෙනවා කියලා කිව්වා. දැන් ඒකට නඩු දාන්න යනවා කිව්වා. ඉතිං මම එයාට කිව්වා වැරදි වැඩක් කරලා

තියෙනවානම්නේ නඩු දාන්නේ කියලා. ඒක නිසා මම ඇහුවා කොහොමද, ගෙදර හොයා ගත්තේ කියලා. සභාපතිතුමා කිවුවා කිවුවේ අපේ ගෙදරට එන විදිය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කවුද.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඔබතුමා කිව්වලු අපිව හමුවන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඔව්, ඕන නම් ළග තියලා අහමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දූරකථන අංකයක් තියෙනවා නම් දැන් කෝල් එකක් ගන්න.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මම ගාව එයාගේ දූරකථන අංකයක් නැහැ. එහෙම තමයි එන පුද්ගලයෝ කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා මට ඔයගොල්ලන්ව හමුවෙන්න යවන්න ඕන නැහැ. මට ඒකට නඩු දාන්නේ නැතුව ඉන්න ඕන නම් ඔයගොල්ලන්ගේ මොන කමිටුවෙන් කිවුවත් මම ඒකට නඩු දාන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒක තමයි සභාපතිතුමා කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට කවුරුවත් යවන්න ඕන නැහැ කාගේවත් ළඟට.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** කතාව කිවුවට පස්සේ ඔබතුමා උත්තරයක් දෙන්නකෝ. ඒක තමයි සභාපතිතුමා මම කියාගෙන නැගිට්ටේ. ඒ පුද්ගලයා එනවා හොඳ මිනිස්සු වෙන්න ඔබතුමාව නරක මනුස්සයා කරලා. ඔබතුමා කිවුවා කියලා කියනවා. ඔය වගේ තමයි ඒ මනුස්සයා ඇවිල්ලා වාඩි වුණේ. මම ළග තියලා අහන්නම්. දැන් යමු ඒ හාඩ්වෙයාර් එකට ඒ මනුස්සයා ඇති. දැන් යමු මම අහන්නේ නැද්ද බලන්න. හැබැයි ඊට පස්සේ තව කතාවක් කිවුවා. සල්ලි එහෙම ඕනනම් කියන්න කිවුවා. විශේෂයෙන්ම අබේසේකර මන්ත්‍රීතුමාට. මම කිවුවා සල්ලි වලට විකිණෙන මන්ත්‍රීවරු නැහැ කියලා. මන්ත්‍රීවරුන්ගේ ගෙවල් අස්සේ මීට පස්සේ රිංගන්න එන්න එපා කිවුවා. මම සල්ලි වලට විකිණෙන මන්ත්‍රීවරයෙක් නෙමෙයි කියලා කිවුවා. මට සෑහෙන්න කතාවක් කිවුවා. මම කිවුවා එහෙම කිවුවා නම් ඒ අය පරණ මන්ත්‍රීවරු නිසා එහෙම ගනුදෙනුවක් කරාද දන්නේ නැහැ කියලා. ඒ අයව ගිහින් හම්බවෙලා කතා කරන්න කියලා කිවුවා. මින් පස්සේ මෙහේ එන්න එපා කියලත් කිවුවා. එහෙම රෙකෝඩින් එකක් තියෙනවා නම් දාන්න කියන්න මම ඉදිරියේදී. අපි සල්ලි වලට විකිණෙන මන්ත්‍රීවරු නෙමෙයි කියලා මම කිවුවා. අබේසේකර මන්ත්‍රීතුමාට චෝදනා කරා. මම කිවුවා එතුමා අපිත් එක්ක මේ මොකක් හරි එකකට ඇවිද්දත්, තේ එකක් බිවුවත් එතුමාගේ ගාන එතුමා දෙනවා කියලා. එහෙම සත පහක්වත් ගන්නේ නැහැ කිවුවා. අපි දන්නේ නැහැ කිවුවා පරණ කාලයේදී කරපු ගනුදෙනු. ඒක ඒ අයගෙන් අහගන්න කියලා කිවුවා. මීට පස්සේ මන්ත්‍රීවරුන්ගේ ගෙවල්වල එන්න එපා කිවුවා ඕවා කතා කරන්න. අපි සභාවෙන් පත් කරපු නීත්‍යානුකූල කමිටුවක්. එතුමා වැරැද්දක් කරලා තියෙනවා නම්, අපිට ගේන්න පුළුවන් නිර්ණායක තියෙනවා. අපි ඒවා දුන්නට පස්සේ සභාවේ ඉන්න නිලධාරීන් ඒක අධීක්ෂණය කරලා ඒක වැරදිද, නිවැරදිද කියලා දුන්නට පස්සේ ඒක සභාවේ අනුමැතියට යටත් කරලා කිවුවා නඩු දාන්නේ. ඔබතුමා මේ කියන විදියට ගෙවල් පිළිකණු වලින් ඇවිල්ලා කතා කරන්න ලෑස්තිවෙන්න එපා කිවුවා. ඔබතුමා ගාව ඕවා නීත්‍යානුකූලව හදන්න, ගොඩකරන්න අවශ්‍ය ලිපිලේඛන තියෙනවා නම් ඒවා අරගෙන ඉදිරිපත් වෙන්න කිවුවා. එයා ඇරෙන්න වෙන කිසි කෙනෙක් අපේ ගෙදරට ආවේ නැහැ. ආයේ නොඑන්නම මම එයාට කියලා දොරට බැස්සුවා. ඒක නිසා ඔය චෝදනා කරන්න එපා. එදා කිවුවා සල්ලි ගන්නවා කියලා. මේවා කෙලින් කියන්න මම වගේ. එහෙම බොරුවට කියන්න එපා. අපි මේ සද්භාවයෙන් මේක කරන්නේ. මේ විදියට ගියොත් මේ සභා බලප්‍රදේශයේ එක බිම් කැබැල්ලක්වත් ඉතිරි වෙන්නේ නැහැ. අනවසර ඉදිකිරීම් සහ ගොඩකිරීම් බොහෝමයක් කරලා තියෙනවා. දැන් ඔබතුමා කියනවා වගේ ඉක්මනට මේක ගොඩ කරා සතියක් ඇතුළත. මම මේකත් කමිටුවේදී කියනවා අන්න අතන ගොඩකරනවා අපි මොකද කරන්නේ කියලා. නඩුවට දෙන උත්තරය බලන්න. ඕවා වෙනකොට ඔය මනුස්සයා කරන්න ඕන ඔක්කොම කරලා ඉවරයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනිත් එක ඒක A ශ්‍රේණියේ කුඹුරක්. කීයටවත් ඒක ගොඩකරන්න බැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** කිසිම ජල කඳක් පාරෙන් මේ පැත්තට මාරු වෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම දන්න තරමින් කුඹුරු පිළිබඳව එතනට එන හැම එක්කෙනාම එයාට යට වෙනවා. නමුත් එකක් තියෙනවා අපි ගිහින් ගොවිජන සේවා එක ගාව උද්ඝෝෂණය කරන්න ඕන මේවාට විරුද්ධව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං ඕකට මාත් එන්නම් ඕනනම්. ඔබතුමන්ලා ගිහිල්ලා ගොවිජන සේවා එක ඉස්සරහ උද්ඝෝෂණය කරන්න වහාම ඕක අයින් කරන්න කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපි අනිවාර්යයෙන්ම ඒක කරනවා. මම ඔබතුමන්ට කිවුවේ ඒකයි. ගරු සභාපතිතුමනි දැන් මේ ක්‍රියාමාර්ග වලදී අපි මේ කමිටුව හැටියට සභාවෙන් දෙන බලතලත් එක්කනේ ක්‍රියාත්මක වෙන්නේ. ඔබතුමා විසින් අපිට පවරපු බලතලත් තියෙනවා. එතකොට අපිට යන්න පුළුවන් සීමාවක් තියෙනවා සහා පනත අනුව අපිට පැවරුන වගකීම අනුව සහ බලතල අනුව. එතනින් එහාට වෙන සිදුවීම් වලට අපිට වගකියන්න බැහැ. ඒක තමයි ඇත්ත. හැබැයි ඒ සම්බන්ධව මොකක් හරි අතුරු ප්‍රශ්නයක් තියෙනවා නම් අපේ නිරීක්ෂණ සහ නිගමන අනුව සභාව විසින් ඒ ආයතන දැනුවත් කරන්න වහාම. ඒ ආයතන ක්‍රියාමාර්ග ගන්නවාද, නැද්ද කියන එක වෙන දෙයක්. ඒක ඒ අයගේ කාර්යයක්. හැබැයි ඒකෙදී මොකක් හරි යම් ප්‍රශ්නයක් මතු වෙනවා නම් කවදා හරි දවසක ඒකෙ වගකීම එන්නේ ඒ අයට. ඒක අපිට එන්නේ නැහැ. ගරු සභාපතිතුමා, ඔබතුමා ඉන්න කාලයේදී ඒවා කරේ නැහැ වෙන්න පුළුවන්. ඒ සිද්ධිය හරි. එතකොට මේවා ඉස්සරහටත් නොවෙන ක්‍රමයක් හදනවානම්නේ හොඳ. අපි ඒකටයි උත්සාහ කරන්නේ. පහුගිය කාලයේදී යම් දේවල් සිද්ධ වුණා. ඒ සිද්ධ වෙච්ච දේවල් වල ප්‍රතිඵල හිතුවොත් හැමදාම ඔබතුමාට බැනුම් අහන්නත්, මිනිස්සුන්ට දොස් කියන්නත් වෙන්නේ. මේවා දැන් කරපුවා නෙමෙයි. ගංවතුර ගලන්න පටන් අරගෙන තියෙනවා. එහෙම නැත්නම් කණ්ඩි කඩාගෙන වැටෙනවා, බැමි කඩාගෙන හැලෙනවා, ගෙවල් පුපුරනවා. දැන් ඒ කියන දේවල් සියල්ල සිද්ධ වෙන්නේ එක දවසින් නෙමෙයි. දැන් උදාහරණයක් ගත්තම ගලක් පුපුරන්නේ අන්තිමට ගහපු කුළු ගෙඩි පහරින් නෙමෙයි. කාලයක් තිස්සේ ගහපු කුළුගෙඩි පහරවල් නිසා අවසානයේදී ඒක පුපුරාවි. ඒ වගේ තමයි කාලයක් තිස්සේ අපි කරපු දේවල් වල ප්‍රතිඵල තමයි දැන් භුක්ති විඳින්නේ. ඒ නිසා අපි මින් ඉස්සරහට එහෙම අනිසි දේවල් අපේ ප්‍රදේශයේ ජනතාවට අත් විඳින්න වෙන්නේ නැති වෙන්න ක්‍රියාමාර්ග තියෙනවා නම් එහෙම ක්‍රමයක් අපි හදාගන්න එක තමයි මේ සභාවේ වගකීම වෙන්නේ. ඒ වෙනුවෙන් තමයි අපි මේ මැදිහත්වීම කරන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි මේක කවුරුවත් කියපු පලියට හෑල්ලුවට ලක් කරන්න හෝ මේකෙන් පුද්ගලයෙක්ව හෑල්ලුවට ලක් කරන්න හෝ සභාව හෑල්ලුවට ලක් කරන්න කරන මැදිහත්වීමක් නෙමෙයි. ඒ නිසා අපි ඒක කරුණාකරලා ඉල්ලා සිටිනවා. මේ කමිටුව සියලු දේශපාලන පක්ෂ වල නියෝජනයක් තියෙන විදියට හදපු කමිටුවක්නේ. දැන් මේක ඇතුලේ කාටවත් කියන්න බැහැ එක පක්ෂයකට හෝ වෙන මොකකට හරි වුවමනාවන් ඉෂ්ඨ කරනවා කියලා. එහෙම එකක් නැහැ. විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි, අපේ මේ කමිටුවත් ඔබතුමාගේ සභාපතිත්වයෙන් තමයි තියෙන්නේ. එතකොට ඔබතුමත් මේකට මැදිහත් වෙනවා නම් අපි කැමතියි. එතකොට ඔබතුමත් ඉන්න තැනනේ මේවා ගැන කතා කරන්නේ. අපි ඔබතුමාට එන්න කියලා කතා කරලා තියෙනවානේ. එතකොට ඇත්තටම කියනවා නම් ඔබතුමාගේ මැදිහත්වීමක් සහිතව ඕන මේක සිද්ධ වෙන්න. ඒ නිසා මේකෙ බලතල තියෙනවා. අපි කමිටුව විදියට මොනවා හරි නිරීක්ෂණය කරලා අපි නිගමනයන් හෝ යෝජනා දුන්නම ඒවා ක්‍රියාත්මක කරන්න ඕන ඔබතුමා. ඒ බලය තියෙන්නේ ඔබතුමාට. එතකොට මේ පුද්ගලිකව මිනිස්සු ඇවිල්ලා කතා බහ කරන ඒවාට මේවායේ තීන්දු තීරණ ගන්න සූදානම් වෙන්න එපා. ඒකට කාටවත් චෝදනා කරන්නත් එපා. එහෙම කරන එක වැරදියි. අපි මුලින්ම කිවුවා ඒක මේ සභාවට එන ප්‍රශ්න වලදී. ඒක අපි පැහැදිළිව දැක්කා. පාරිසරික හානි, ගොඩනැගිලි වලට සිදු වන හානි සම්බන්ධව ඒ අදාළ ආයතන සම්බන්ධ කරලා අපිව දැනුවත් කරන්න කියලා කිවුවා. ඔබතුමා පහුගිය කාලයේදී ඒ ආයතන කැඳෙව්වා. එතකොට ඒ කැඳවීමත් එක්ක අපි අවබෝධ කර ගත්තා යම් යම් මැදිහත්වීම් කරන්න ඒ ආයතන වලට තියෙන බලතල පිළිබඳව. එතකොට සභාවට බලතල තියෙන්නේ යම් ප්‍රමාණයකට. ඒ නිශ්චිත බලතල සම්බන්ධීකරණය කිරීමේ බලතල එන්නේ සභාවට. ඒ නිසා ඔබතුමා මේකෙදී පුද්ගලයෝ කියන කරුණු කාරණා පදනම් කර ගන්න එපා. මේ ගන්න ක්‍රියාවලට නිවැරදි තීන්දු ගන්න. ඔබතුමාට කෙලින් ඉන්න පුළුවන් ඒ නිවැරදි තීන්දු වලට. මම ගත්තේ නිවැරදි තීන්දුවක් කියලා කියන්න පුළුවන්. ඔබතුමා ඉන්න කාලයේ ඉදිකරන්න අවසර දීපු එකක් නෙමෙයි වුණාට වැරැද්දක් වෙලා තියෙනවා නම් තව කෙනෙකුට හානියක් වෙනවා. ඒක නරක පූර්වාදර්ශයක් වෙලා තියෙනවා. දැන් උදාහරණයකට ගත්තොත් එහෙම පහුගිය දවස්වල කරපු ඒවාගෙන් අපිට මොකක් හරි කිවුවොත් එහෙම මොකද කරන්නේ. අපේ එක විතරද හොයන්නේ, අර කරපුවා බලන්නේ නැද්ද කියලා අහනවා. දැන් එහෙම නේ විවේචනය කරන්නේ. ඒ නිසා කවදාවත් ඉවර වෙන්නේ නැහැ ඒ වැඩේ. කරපු ඒවා දිහා බල බල කර කර ඉන්නවා. ඉතිං එතනට තල්ලු වෙන්න එපා මේ වැඩේදි. ඒ නිසා කරුණාකරලා කවුරුත් මේ වැඩේට එකතු වෙලා කරන්න සහයෝගය දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි. දැන් 14 ක් දීලා තියෙනවා. ඒ 14 ගැන අපි ඉස්සෙල්ලා කතා කරලා ඉවරයක් කරලා ඉමුකෝ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක තමයි. අපිට ඔබතුමා පැහැදිළි කරන්න මේ මොහොත වෙන කොට ඒවාට ගනිපු ක්‍රියාමාර්ග මොනවද, ඒවාට තියෙන ප්‍රතිචාර මොනවද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ඒවායින් කිහිපයකට දූන් නඩු පවරලානේ තියෙන්නේ. ඒ 14 තියෙන ප්‍රශ්න මට කියන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දූන් ඔබතුමා ඉතා නිවැරදි තැනක ඉන්නවා. අපිත් මේක දූක්කා. අද ගේන්න යෝජනාවක් ඔබතුමාම ගොවිජන සේවා එකට වහාම මේවාට ක්‍රියාමාර්ග ගන්න කියලා. නැත්නම් අපි එතනට ගිහිල්ලා ලගිනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම යෝජනා කරනවා අපේ සභාව හැටියට ඒවා දූනුවත් කරන්න. අපි ඒ යෝජනාව කරනවා කමිටුව විදියටම. මේ අපේ බල සීමාවට එහා ගියපු ආයතන වලට වගකීම් තියෙනවා නම් ඒ වගකීම් සහිත ආයතන සියල්ලටම වහාම ලිඛිතව දූනුවත් කරලා ක්‍රියාමාර්ග ගන්න සති දෙකක හෝ කාල සීමාවක් ලබා දීලා මේ සම්බන්ධව ක්‍රියාමාර්ග නොගන්නේ නම් අපිට පෞද්ගලිකව හෝ සභාව හැටියට මේවාට මැදිහත් වෙන්න සිදු වෙනවා කියලා. විශේෂයෙන්ම ගොවිජන සේවා එකට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං ඔය තැන නම් කරලම ගෙනාවම ඉවරයිනේ. එහෙම එකක් ගෙනාවේ නැහැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නම් කරලා ගේන්නම්. ඔබතුමා නම් කරලා ගේන්න මම ස්ථිර කරන්නම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** දහනායක හාඩ්වෙයාර් එකට අදාළ අනවසර ගොඩකිරීම සම්බන්ධයෙන් අපි අදාළ ආයතන දූනුවත් කරන්න යෝජනා කරනවා. එහෙම කරන්නේ නැත්නම් අපි ඉදිරි ක්‍රියාමාර්ග ගමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, ඒ යෝජනාව ස්ථිර කරමින් මම ඒකට තව සංශෝධනයක් ඉදිරිපත් කරනවා. ඒක ප්‍රමුඛයි. බෝපෙ පෝද්දල බල ප්‍රදේශයේ තියෙන අනවසර ගොඩකිරීම් පිළිබඳව වහාම පියවරක් ගන්න ඕන. ගොවිජන සේවා එක සම්බන්ධව තියෙන්නේ නරක චිත්‍රයක්. ක්‍රියාමාර්ග ගන්නේ නැත්නම් සති දෙකක් ඇතුළත සභාපතිතුමා ඇතුළු අපි සියලු දෙනාම ගොවිජන සේවා එක ළඟට ගිහිල්ලා ඒකට විරුද්ධව ක්‍රියා කරමු. මේකට අපේ සියලුම මන්ත්‍රීවරු අත් උස්සලා කැමතියි කියලා කියන්න.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** අනිත් එක තමයි සභාපතිතුමා එතන අර දෙපැත්තේ තියෙන කණු දෙක අතරින් දොරුවක් තියෙන නිසා වැස්සක් වැස්සම ප්‍රධාන පාර යට වෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ ඔක්කොම යට වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනිත් එක නියමෙට කන්ටේනර් එක දාලා හරස් කරලා ඇතුලෙන් ඔක්කොම ගොඩකරා .

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඊයේ, පෙරේදත් මම ඒක ගැන කතා කරා. ඒකට මොකක් හරි කරන්න ඕන. අපි නිතර දෙවේලේ යන තැන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකෙත් නිලධාරි කොටසක් අසරණ වෙලා ඉන්නවා. ඒක එක තැනකින් එහාට යන එක සිදු වෙන්නේ නැහැ. මම ඒකට කතා කරා. බොහොම අසරණ නිලධාරීන් ඉන්නවා ගොවිජන සේවා එකේ.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** ඒ අසරණකම ලොකු මිනිස්සුන්ටනේ. පොඩි මිනිස්සුන්ට කිසිම අසරණකමක් නැහැනේ සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කවුරු මොනවා කිවුවත්, ඔබතුමා හරි තීන්දුවක් ගන්නවා නම් හරි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි තීන්දු අරගෙන තියෙනවා. අපි නඩු දාන්න භාර දීලා තියෙන්නේ ඒකට.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ දාපු නඩු ඉස්සරහට යන එක ගැන අපි අවධානයෙන් ඉන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එක නඩු වාරයක් ගියා. ඒකට එයා ආවේ නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒකට ආවේ නැහැ. පිස්කල් එකෙන් ඒකට භාර දීලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ජීවත් වෙන්න තැනක් නැතුව යම්තම් පැලක් අටවා ගන්න පර්චස් එකක් දෙකක් ගොඩකරොත් ඒකට මරාගෙන මැරෙන්න හදනවා. මහා පරිමාණයෙන් කරන ඒවාට ක්‍රියාත්මක වෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** අනිත් එක මෙයාට වුවමනාව ඇති අපි දෙගොල්ලෝ අතර, ඝට්ටනයක් ඇති කරලා මේක යට කරලා නැති කරලා දාන්න. එහෙම උපක්‍රමශීලිව කටයුතු කරනවා කියලා මට පේනවා. ඔබතුමන්ලාගේ වැරදි අපිට කියනවා. ඒගොල්ලෝ එන්නේ ඒ මට්ටමෙන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ලේකම්තුමා මේ ලිපිය හෙට දවසේම වගකීමක් විදියට අරගෙන වහාම යවන්න. එහෙම නොවුනොත් 26 වන සිකුරාදා අපි යමු සභාපතිතුමා. නැත්නම් සභාපතිතුමා ඔබතුමා දිනයක් කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 26 වෙනිදා පෝය. ඒ ලියුම අද අපි යවන්නම්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** 25 වෙනිදා අපි යමු මේකට ක්‍රියාමාර්ගයක් ගන්නේ නැත්නම්.

අපිට පොඩි පැහැදිලි කිරීම් ටිකක් කර ගන්න මම කාරක සභාවක් යෝජනා කරනවා. මොකක්ද දැනට මේ අයට තියෙන අපහසුතාවය කියලා දැන ගන්න ඕන ඒ වාර්තාව දෙන්න බැරි වීමට. නැත්නම් මේ වාර්තාව සති දෙකක් ඇතුළත අපිට ලබා දෙන්න.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** කාණුව කපලා නැහැනේ. කමිටුවෙන් දීපු තීන්දු ක්‍රියාත්මක වෙලා නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තවත් මතක් කිරීමක් කරන්න තියෙනවා. අපේ සභාවේ දීර්ඝ කාලයක් සංවර්ධන වැඩ කටයුතු වලට විශාල දායකත්වයක් දක්වපු තාක්ෂණ නිලධාරි දිනූෂ මහත්තයා සහ ගුණසේකර මහත්තමයා ස්ථාන මාරු කරලා තියෙනවා වාර්ෂික ස්ථාන මාරු කිරීම යටතේ. ඉතිං එතනදී දිනූෂ මහත්තමයා දිගින් දිගටම ස්ථාන මාරුවීම් යාමට ඉල්ලීම් කරලා තිබුණා. එතුමා ඇත්තටම සෑහෙන්න සේවයක් බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව වෙනුවෙන් කරා. යම් යම් මන්ත්‍රීවරු අතර, මොන තරම් ගැටුම් තිබුණත් එතුමා ඍජුව ගොඩක් අවස්ථා වලදී යම් යම් දේවල් වලට පෙනී සිටියා. අඩුපාඩුකම් තිබුණා. ඕන කෙනෙක්ගේ, මගේ වුණත් අඩුපාඩුකම් තියෙන්න පුළුවන්. ඕන කෙනෙකුට ඒක වෙන්න පුළුවන් දෙයක්. මම ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා ඔබතුමා මේ ස්ථාන මාරුව යන මොහොතේ කවුරුන් සමග හෝ හිත් රිදීමක් තියෙනවා නම් ඒක මෙතනින් ඉවර කර ගන්න. එතුමත් එක්ක මම කතා කරා. එතුමා එකග නැහැ රැඳී ඉන්න. මම දැනුත් ඇහුවේ ඒක. අනිත් එක මේ අවස්ථාවේදී ස්ථාන මාරුව අවලංගු කරලා රැඳී ඉන්න එතුමා කැමති නැහැ. වැඩි දුරකටත් නෙමෙයි එතුමා යන්නේ බද්දේගමට. එතුමා මම හිතන්නේ අවුරුදු අටක් සේවය කරලා තියෙනවා බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ. ඉතිං ඒක තුළ මම සභාපතිවරයා විදියට එක අතකින් කණගාටුවන අතර, එක අතකින් එතුමාගේ බද්දේගමට යන ස්ථාන මාරුව පිළිබඳව අපි අපේ සතුට ප්‍රකාශ කරනවා. ගුණසේකර මහතාගේ ස්ථාන මාරුව අවලංගු කරන්න කියලා අපි ඉල්ලීමක් කරලා තියෙනවා. මොකද, දෙන්නෙක් එක පාරට ස්ථාන මාරු කරන එක ගැන නැවත පළාත් පාලන කොමසාරිස්තුමා සමග කතා කරන්න ඕන. ඒකට උපරිම උත්සාහයක් දරනවා ඒ ස්ථාන මාරුව අවලංගු කර ගන්න. මම මේ අවස්ථාවේදී දිනූෂ රත්නප්‍රිය තාක්ෂණ නිලධාරි මහතාට ආරාධනා කරනවා කාරක සභා අවස්ථාවක් කරලා එතුමාට මන්ත්‍රීවරුන්ට ප්‍රකාශයක් කරන්න කියලා. මම ඒකට කාරක සභා අවස්ථාවක් යෝජනා කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

කාරක සභා අවස්ථාවේදී තාක්ෂණ නිලධාරි දිනූෂ රත්නප්‍රිය මහතා පහත අදහස් දක්වා සිටින ලදී.

- ආධුනික තාක්ෂණික නිලධාරියෙකු ලෙස පළවෙනි පත්වීම ලබා 2012 වර්ෂයේදී බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ සේවයට පැමිණි බව.
- රාජ්‍ය සේවයේ සහ ප්‍රාදේශීය සභාවේ අදාළ රාජකාරි කටයුතු සේවයේ යෙදී සිටීමෙන් ලද අත්දැකීම් උපයෝගී කරගෙන ඉගෙන ගත් බව.
- තම රාජකාරි දිවියේදී මුහුණ පෑමට සිදු වූ විවිධාකාරයේ ගැටළු සම්බන්ධව.
- රාජකාරි කටයුතු අතරතුරදී සිදු වූ අතපසුවීම් සහ හිත් රිදීම් සම්බන්ධව මෙන්ම තම දැඩි තීරණ හමුවේ සිදු වූ දේවල් සම්බන්ධව සමාව ඉල්ලා සිටින බව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාරක සභා අවස්ථාව අවසන් කිරීම සඳහා මම යෝජනා කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මට විනාඩියක කාලයක් ලබා දෙන්න. ඇත්තටම එතුමාගේ පළවෙනි පත්වීම මෙහේ කිවුවා. මම හිතන්නේ ඇත්තටම පළවෙනි පත්වීම මෙහේ වුණාට එතුමා ලොකු දක්ෂතාවයකින් වැඩ කරපු නිලධාරියෙක්. නිකං කිවුවොත් එහෙම එතුමාගේ පළවෙනි පත්වීමෙදිම එතුමා සුදුසු තැනට තමයි ආවේ. කවුරුත් ආසයිනේ යුරෝපයට යන්න. එංගලන්තය ඇතුළු යුරෝපයේ රටවල් වලට යන්න කවුරුත් ආසයි. හැබැයි ප්‍රසිද්ධ කියමනක් තියෙනවා යුරෝපයට යන්න ඉස්සෙල්ලා ආසියාවේ ඉන්දියාව වගේ රටකට ගිහිල්ලා එන්න කියලා. ඒකෙ තේරුම ඉන්දියාවට ගියාම තියෙනවා හැම භාෂාවක්ම, හැම ආගමක්ම. තව විවිධ දේවල් තියෙනවා. ඉන්දියාවට ගියාම ඕන තැනකට යන්න පුළුවන්. ඒ නිසා මම විශ්වාස කරනවා කිසිම ප්‍රශ්නයක් නැතුව එතුමාගේ රාජකාරි දිවියේ පළවෙනි පත්වීම විදියට මෙතන හිටියා නම් ලංකාවේ ඕනම තැනකට ගිහිල්ලා ඉන්න පුළුවන්. ඒක හින්දා එතුමාට ඒ දක්ෂතාවය තිබුණා. ඇත්තටම මම සාමාන්‍යයෙන් පෞද්ගලිකව කවදාවත් කිසිම නිලධාරියෙක්ගෙන් ඇහුවා ඇරෙන්න මේක මෙහෙම කරන්න ඕන එහෙම කියලා නැහැ. මෙයා අඳුරනවා, එයා පොඩ්ඩක් ආවම බලන්න කියලා තමයි කිවුවේ. එච්චරම තමයි මම කියලා ඇත්තේ. මම වෙන කිසිම දෙයක් කියලා නැහැ. අනිත් නිලධාරීන් දෙන්නත් මෙතන ඉන්නවා. ඒක හින්දා මම හිතන්නේ අප සියළුදෙනාගෙන්ම මොන ප්‍රශ්න තිබුණත් සහෝදර මන්ත්‍රීවරු අපිටත් කියලා තියෙනවා දුක් ගැනවිලි. එතුමත් අපිට දුක් ගැනවිලි කියලා තියෙනවා. සභාපතිතුමත් මැද ඉඳගෙන බොහොම අමාරුවෙන් ඉන්නවා කොහොමද මේවා විසඳන්නේ කියලා. හැබැයි මම නැවතත් ඉල්ලා සිටිනවා ඒක මතක් කරපු හින්දම ඒවාගේ තීන්දු තීරණ ගන්න එපා ඉක්සරහට. ඒකට තියෙනවා පොඩි පේපර් එකක් දාලා ඒක එහෙම කරන්න. ඒ මන්ත්‍රීවරුත් කියනවා මෙයා එක්ක වැඩ කරන්න බැහැ කියලා. එතකොට මේක මහ අවුලක්. ඉතිං මේක හින්දා මම හිතන්නේ අපිට අත්දැකීම් එන්නේ මේවත් එක්ක. ඉතිං ඒක හින්දා අපි සියළුදෙනාගේම ආශිර්වාදය එතුමාට අපි ප්‍රාර්ථනා කරනවා දක්ෂ නිලධාරියෙක් වෙලා බබළන තැනක ඉන්න කියලා. මොකද දැන් එතුමා අපේ බලප්‍රදේශයේ පුරවැසියෙක්. අපේ ඡන්ද දායකයෙක්. ඒ නිසා එතුමාට සුභ පතනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මටත් පොඩි වෙලාවක් ගන්න ඕන. මොකද මම නියෝජනය කරන කොට්ඨාශය, බලප්‍රදේශය නියෝජනය කරමින් ස්ථිර පදිංචිය වෙලා ඉන්න කෙනෙක් මේ. ඇත්තටම මේ මොහොතේ රාජකාරි වශයෙන් සමුගෙන යන දිනූෂ මහතා සම්බන්ධව පොඩි වචන ස්වල්පයක් කියන්න ඕන. හේතුව මම හිතන්නේ මේ සභාවට මම එන්න කලින් එතුමා සමඟ කතා බහ කරලා තියෙනවා වැඩ වලදී. අපි මැතිවරණයට ඉදිරිපත් වෙලා සභාවට එන්න කලින් එතුමා ගැන දැනීමක් සහ අවබෝධයක් මටත් තිබුණා. මම දැකපු හොඳම කාරණය තමයි එතුමා සාමාන්‍යයෙන් වැඩ කරන්න ගියාම සංවේදීව, මානුෂිකව, තීන්දු තීරණ වලට එළඹෙන අවස්ථාවන් මම අත්දැකලා තියෙනවා. ඒක නිලධාරියෙකුට තියෙන හොඳ ලක්ෂණයක්. ඒ වගේම තමයි එතුමා ආරම්භක කතාවේදීම කිවුවා මම මෙතනට ආපු හැටියෙම, පරිවාස කාලයේදීම චෝදනා පත්‍රයකින් නිදහසට කරුණු කාරණා විමසුවා කියලා. ඒක එතුමාට ලොකු අත්දැකීමක් වෙලා තියෙනවා. වළකට වැටුණම මොළයට ලාභයක් කියනවානේ. ඒ නිසා දැන් එතුමා ඒකෙනුත් අත්දැකීමක් අරගෙන බොහොම පරිණත විදියට රාජකාරි කරලා ඒ සම්බන්ධව ඉගෙන ගෙන තිබීම අපිට දැනෙනවා. එතුමාට මම සුභපතනවා. විශේෂයෙන්ම රාජකාරියේදී ජනතාවට යම් සේවයක් කරන්න පුළුවන් විදියට මැදිහත්වීමක් කරන්න පුළුවන් තනතුරක් මේක. මොකද මිනිස්සුත් එක්ක ඔවුන්ගේ පෞද්ගලික ජීවිතයේ අවශ්‍යතාවයන් වලට මේ මැදිහත් වෙන්නේ. ඒ නිසා බෝපෙ පෝද්දල ජනතාව වෙනුවෙන් මෙතෙක් කරපු සේවයට ස්තුති කරමින් එතුමාගේ අනාගත රාජකාරී ජීවිතය සාර්ථක වෙන්න කියලා සුභ පතමින් මම නිහඬ වෙනවා. බොහෝමත්ම ස්තුතියි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම තමයි දිනූෂ මහතා වෙනුවෙන් සුභ පතන්නත් ඕන කියලා මට හිතෙනවා. හේතුව ගරු සභාපතිතුමනි, එතුමා පත්වීම ලබලා ප්‍රාදේශීය සභාවට ආවට පස්සේ වැඩිම කාලයක් මාත් එක්ක මගේ කොට්ඨාශයේ තමයි වැඩිපුරම සංවර්ධන කටයුතුවලට දායක වුණේ. මොකද ඒකට හේතුව මාත් එක්ක එතුමා බොහොම හිතවත්කමකින්, සහෝදරත්වයකින් සේවය කරා. ජනතාවගේ ඉල්ලීම් අපිට ලැබෙන කොට යම් යම් වෙලාවට අපේ තාක්ෂණ නිලධාරි මහත්මයාට දැනුම් දුන්නම එතුමා යනවා. ඇත්තටම ජනතාව මෙතුමා කිවුවා වගේම අපිට කියන දේ නෙමෙයි තාක්ෂණ නිලධාරි මහතාට ප්‍රකාශ කරන්නේ. ඒ නිසා අපි දෙගොල්ලෝ අතර යම් යම් මතභේද, ගැටුම් ඇති වුණා. විශේෂයෙන්ම දිනූෂ මහතා මාත් එක්ක අමනාප වෙලා හිටියා මෑතක් වෙනකම්ම. දැන් මීට දවස් දෙක තුනකට කලින් තමයි මම දුරකථනයෙන් එතුමා අමතා කතා කරේ. ඒ කාල සීමාව තුළ අපි සිදු කරේ ජනතාවට සේවය කරන එක. ඉතිං ජනතාවට සේවය කරද්දී අඩුපාඩුකම් මගෙනුත්

දිනූෂ මහත්තයාගෙනුත්, සමහර විට සභාපතිතුමා කිවුවා වගේ සභාපතිතුමාගෙනුත් වෙන්න පුළුවන්. ඒ නිසා ඒ සියල්ලම අද අවසන් කරලා ඔබතුමා වෙනත් ආයතනයකට සේවයට යන කොට අපි ඔබතුමාට සුභ පැතුම් එකතු කරන්නේ මීටත් වඩා ඉහළ තනතුරකින් බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පුරවැසියෙක් හැටියට නැවතත් සේවය කරන්න මෙම ආයතනයට පැමිණෙන්න ශක්තිය, ධෛර්ය හා වාසනාව ලැබේවා කියලා. මම නිහඬ වෙනවා. බොහොමත්ම ස්තූතියි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම හිතන්නේ දිනූෂ මහතා කියන්නේ අති දක්ෂ නිලධාරියෙක් තාක්ෂණ නිලධාරියෙකු වශයෙන්. මම හිතන්නේ ජනතාව සමඟ සේවය කරද්දී සමහර විට විවිධ ගැටුම් වලටත් මුහුණ දෙන්න සිදු වුණා. තමාගේ රාජකාරි දිවියේ වගකීම් ඉටු කරන්න යද්දී සමහර විට පෞද්ගලික අමනාපකම් වෙන්න සිද්ධ වුණා. සමහර මන්ත්‍රීවරු අතරත් සට්ටනයන් සිදු වුණා අපේ දිනූෂ මහතාට තාක්ෂණ නිලධාරියෙක් වශයෙන්. නමුත් එතුමා කරපු සේවය අපි බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව වශයෙන් සියළු මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් ඒ වගේම ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා ලේකම්තුමා ඇතුළු සියලුම නිලධාරීන්ගේ ගෞරවය මම හිතන්නේ මේ අවස්ථාවේදී අපි දිනූෂ මහතාට පුදකර සිටිනවා. ඒ වගේම අපි ඉල්ලා සිටිනවා පුළුවන් නම් තවත් ඔබතුමාගේ සේවය බද්දේගමට නොගොස් නැවතත් අපේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවටම ලබා දෙන මෙන් ඔබතුමාගෙන් අපි ආයාචනා කර සිටිනවා. ඒ වගේම එසේ නොහැකි වුණොත්, ඔබ අකමැතිනම්, ඔබ මොන ස්ථානයට සේවය සඳහා ගියත් තාක්ෂණ නිලධාරියෙකු වශයෙන් ඔබ කළ සේවය ඉතා අගය කොට සලකනවා. ඒ නිසා ඔබතුමාට බද්දේගම ප්‍රාදේශීය සභාවට යාමේදී, ඔබතුමාට ඒ කර්තව්‍යයන් සිදු කිරීමේදී ශක්තිය, ධෛර්යය, වාසනාව නොඅඩුව ලැබේවා කියලා අපි සියළුම මන්ත්‍රීවරු වශයෙන්, මන්ත්‍රීවරියන් වශයෙන් ගරු සභාපතිතුමා සහ උප සභාපතිතුමා වශයෙන්, ලේකම්තුමා ඇතුළු සියළුම නිලධාරීන් වශයෙන් අපි මේ අවස්ථාවේදී පුද කර සිටිනවා.

ඒ වගේම මතක් කරන්න ඕන දිනූෂ මහතා වසර අටක පමණ කාලයක් මේ ප්‍රාදේශීය සභාවේ සේවය කිරීමේදී ජනතාවට විශාල මෙහෙවරක් කරා අපේ ප්‍රාදේශීය සභාව වෙනුවෙන්. ඉතිං ඒ ගැනත් මතක් කරන්න ඕන. එතුමාට සුභාශිංෂන යොමු කරමින් මම නිහඬ වෙනවා බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම සුභ පැතුවේ නැති වුණොත් මේකට කික් එකක් නැහැ. ඒකයි සුභ පතන්න ගත්තේ. ඇත්තටම එතුමාට ඒ ස්ථාන මාරුව සඳහා මම සුභ පතනවා. එතුමාට තම රාජකාරි දිවියේ ඉහළම තනතුරකට යන්න හැකියාව ලැබේවා කියලා මම සුභ පතනවා. ඇත්තටම මම ප්‍රාදේශීය සභාවට ආව මුල් කාලයේදී එතුමා සමඟ බොහොම සුහදව වැඩ කරා. මට ඇස්තමේන්තුවක් ගැන හරි අවබෝධයක් ලබා ගන්න එතුමා තමයි කියලා දුන්නේ. හැබැයි අර පොඩි ප්‍රශ්නයක් නිසා වෙච්ච හිත් අමනාපය ඇරෙන්න මට එතුමා එක්ක කිසිම ගැටළුවක් නැහැ. ඒක කියන්න ඕන. ඒක මෙතුමත් දන්නවා. මේ ප්‍රශ්නය නිසා ඇතිවෙච්ච ස්ථාන මාරුවක් නෙමෙයි මේක. මෙතුමා මේක ඊට කලින් ඉඳලම ඉල්ලලා තිබුණා. ඉතින් ඒ නිසා එතුමා සමාව ඉල්ලුවා වගේම මම එතුමාගෙනුත් සමාව ඉල්ලනවා. මොකද මෙතනින් යනකොට, මේ ආයතනයෙන් යනකොට හිත් අමනාපයකින් යන්න අවශ්‍ය නැහැ. එතුමා කියපු වචනයට මම එකඟ වෙනවා. මොකද මග තොටේදී හමුවුණාම හිනාවෙලා, කතා කරලා යන්න ඕන. ඒ විදියට ඉන්න ඕන. මගේ කිසිම ගැටළුවක් නැහැ මෙතුමා එක්ක. ඔබතුමා සමාව ඉල්ලුවා වගේම මම ඔබතුමාගෙන් සමාව ඉල්ලනවා යම්කිසි සිත් තැවුලක් සිදුවුණානම්. මම ඔබතුමාට සුභ පතනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇත්තටම සභාපතිතුමා විදියට එතුමාව මමත් විවේචනය කරලා තියෙනවා. ඒක මම නැහැ කියන්නේ නැහැ. යම් යම් කාරණා වලදී ඒක වුණා. ඒ වගේම මම එවලේ එතුමාව ගෙන්වලා ස්ථාන මාරුව යවන්නත් හිටියා එක වෙලාවක. නමුත් මම එවලේ එතුමාට දේවල් පෙන්වලා දීලා, එතුමා සමඟ යම් එකඟතාවයකට ඇවිල්ලා කටයුතු කරා. ඊට පස්සේ මම ඒ ගැටුම් ඇතිවෙද්දී එතුමාව අභ්‍යන්තර ස්ථාන මාරුවක් කිරීමටත් උත්සාහ දැරුවා. නමුත් එතුමා ඒකට එකඟතාවයක් පළ කරේ නැහැ. එතුමාට සභාව ඇතුළේ අභ්‍යන්තර ස්ථාන මාරු වෙන්න බැහැ, මේ සභාවෙන් ස්ථාන මාරුව යනවා කියන මතයේ එතුමා දිගටම හිටියා. ඉතින් ඒකෙදී ඇත්තටම කණගාටුවෙන් වුණත් අද එතුමාට බද්දේගම ප්‍රාදේශීය සභාවට යන්න අපි අවසර ලබා දෙන්න ඕන. ඒ වගේම මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේදී යම් අඩුපාඩුවක් ඔබෙන් සිදුවුණාද, ඒ අඩුපාඩුකම් නිවරදි කර ගන්න. නැවත ඔබතුමා අවුරුදු ගණනාවකින් මෙහෙට එන්න පුළුවන්. ඒක අපිට කිසිම ප්‍රශ්නයක් නැහැ. ඔබතුමා අවුරුද්දකින් මෙහෙට ආවත්, ඒක අපිට ප්‍රශ්නයක් නැහැ. නමුත් මේ වෙලාවේදී ඔබතුමා වෙනසකටත් එක්ක ඒක කරන්න. මම දකින්නේ අවුරුදු අටක් එක තැනක රාජකාරි කරා ඔබතුමා. මමත් රාජ්‍ය සේවයේ හිටපු කෙනෙක්. උදාහරණයක් කියන්නම්. අපිත් එක්ක හිටපු එක සමෘද්ධි සංවර්ධන නිලධාරි මහත්මියක් බාහිර උපාධියත් සමඟ කළමනාකරු වෙලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවයට ගියා.

එතුමිය මගෙන් ඉල්ලීමක් කරා පසුගිය දිනක මේ කොට්ඨාශයට ස්ථාන මාරුවක් අරගෙන දෙන්න කියලා. මම එතකොට කිවුවේ එතුමියට මෙහෙට එන්න එපා වෙන තැනකට යන්න කියලා. බෝපෙ පෝද්දලට එන්න එපා කියලා මම කිවුවා. මෙහේ හිටපු සංවර්ධන නිලධාරින් ඉන්නවා. එහෙම ආවම අනිත් අය එයාව ගණන් ගන්නේ නැහැ. ඒක තමන් දැනගන්න ඕන. මම ඒක එතුමියට පහදලා දුන්නා. එතුමිය ඒක පිළිගන්නවා. ඒක එතුමිය පිළි අරගෙන එතුමිය මෙහාට ස්ථාන මාරුව ඉල්ලුවේ නැහැ. මම කියන්නේ ඔබතුමාට හොඳම දේ මේ වෙලාවේදී අලුත් ප්‍රාදේශීය සභාවකට යන එක. මගෙන් අනුර සභාපතිතුමා දුරකථන ඇමතුමක් ලබාදීලා ඇහුවා. මම කිවුවා කිසි ප්‍රශ්නයක් නැහැ, පොඩ්ඩක් ආවේගශීලියි, වැඩට කිසි ප්‍රශ්නයක් නැහැ කියලා. වැඩ ගැන ඕන වෙලාවක, ඕන දේකට කියපු ගමන් යනවා කියලා මම කිවුවා. ඔබතුමාට ඕන නම් ඒක එතුමාගෙන් අහන්න පුළුවන්. ඒක මම කිවුවා. ඉතින් ඒකෙදී ඇත්තටම ඔබතුමාගේ ඉදිරි ගමනට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විදියටත්, මේ සියලුම මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා වෙනුවෙන් මම ඔබතුමාගේ ගමනට සුභාශිංෂන එක්කරනවා.

අද දිනයේ අසනීප තත්ත්වයේ පසුවන නිසා මහා සභා රැස්වීමට සහභාගි වෙන්න හැකියාවක් නැහැ කියලා රංගනී මන්ත්‍රීතුමියයි, ඩඩ්ලි මන්ත්‍රීතුමයි නිවාඩු අනුමත කරන්න කියලා ඉල්ලා සිටියා. ඒ දෙදෙනාට නිවාඩු අනුමත කරන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මීළඟ මහා සභා රැස්වීම ලබන මාසයේ තුන්වෙනි සතියේ බදාදා, ඒ කියන්නේ මාර්තු මස 17 වෙනි බදාදාට මාරු කරා. මොකද අක්මීමණ ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමත් පැවැත්වෙන්නේ මාසයේ තුන්වෙනි සතියේ අඟහරුවාදා නිසා මාධ්‍යවේදීන්ට සහභාගිවීමේ ගැටළුවක් තියෙනවා. ඒක හින්දා ඒ දිනය වෙනස් කරා.

**සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.**

මීළඟ මහා සභා රැස්වීම 2021-03-17 වන බදාදා දින පෙ.ව 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීම අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.